30th Anniversary 1986 2016 Christ The King Church · Pannipitiya



## ක්‍රිස්තුරාජ දේවස්ථානය - පන්නිපිටිය

# වාර්ෂික මංගලෝත්සවය - 2016

ක්‍රිස්තුරාජ දෙව් මැදුර ස්ථාපිත කිරීම හා ධර්මදූත කටයුතු ඇරඹීම - 1929

පන්නිපිටිය මීසමක් ලෙස ප්‍රකාශයට පත්කිරීම - 1959

නව ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැදුර විවෘත කිරීම - 1986



පන්නිපිටිය ක්‍රිස්තුරාජ දේවස්ථාන ධර්ම සේවා සභාව



# ක්‍රිස්තුරාජ නව දෙව් මැදුරේ
# 30වන වාර්ෂික මංගලෝත්සවය

2016 නොවැම්බර් මස 20වන ඉරු දින...

# පිදුම

විහිදුවා ඔබ තේජස
වැඩ සිටි විරාජමානව
සැම දනා සිත් පුබුදන
රජිඳු ඔබමයි සමිඳේ නිබඳව...

පන්නිපිටිය මීසම
කැපවූයේ ඔබ නමට ම
දශක අටකට අධික කාලය
රැකුනේ අප සැම සෙවනේ ඔබතුම...

නව දෙව්මැදුර සාදා
පිදුව ඔබතුම නමට පෙර දා
දශක තුනකුත් ඉකුත් වීලා
සමිඳු වැජඹෙයි ප්‍රේමේ පතුරා...

තිස්වන වසර උදෙසා
මංගලෝත්සවය අභිමනින් සමරා
ඔබට තුති දෙන මොහොතේ දනයා
වඳිමු ඔබතුම දෙපා බැතිනා...

ගන්න සමිඳුනි ඔබගේ දෑතට
අපගේ දහදිය, කඳුළු, ශ්‍රමය ද
පුදමු ඔබතුම වෙතට අප අද
ඔබෙන් අප ලද අපේ දිවියම...

නීතිඥ ලසන්ත මනෝජ් නානායක්කාර
සංස්කාරක



# කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ සුභාශිංසන පණිවිඩය

විශ්ව මංගල්‍යයක් ලෙස කිතුණු සැමදෙනා එකම දිනයේ සමරණ මංගල්‍ය අතරින් සබත් දිනයේ දී පවත්වන ක්‍රිස්තු රජාණන්ගේ මංගල උත්සවය ජීවිත පණිවිඩයකි. එහි යථාර්තය සැමට පොදු වුව ද තම මීසමේ කැප කිරීම ක්‍රිස්තුරජාණන්ට වන්නේ නම් එය මහෝත්සවයකි. ඉදින් දශක අටකටත් අධික ඉතිහාසයකට උරුමකම් කියන මීසමක ගරු මාකස් ෆර්ඩිනැන්ඩස් පියතුමා මහරගම මීසම් වාසීන්ගේ සහයෝගය සමඟ, පන්නිපිටිය භූමි පුත්‍රයන් හා එකට එක්ව මීට තිස් වසරකට පෙර ජාත්‍යන්තර සම්මානයෙන් පිදුම් ලැබීමට තරම් අවස්ථාව ලැබූ ගෘහ නිර්මාණයකින් යුත් ඔබ දෙව් මැදුරේ 30වන සංවත්සරය නිමිත්තෙන් නිකුත් කරන සඟරාවට සුබ පැතුම් එක් කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වන්නෙමි.

මෙම වාර්ෂික මංගල්‍යය අරඹයා ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමාන්විත පැමිණීම හෙවත් උන්වහන්සේ දෙවන වරට මේ ලෝකයට පැමිණීම සම්බන්ධයෙන් දෙන්නා වූ, ජීවිතයේ දේව කැමැත්ත ඉෂ්ට සිද්ධ කරන්නට ඉඩ ප්‍රස්ථාව, ජීවත්ව සිටින කෙටි කාලය තුළ දී මනා සංයමයකින් ක්‍රියාවට නංවාලන්නටත් කෙදිනක හෝ මේ ලෝකයේ ජීවත්ව සිටින්නාවූත් ජීවතුන් අතරින් සමුගත්තාවූත් සැමට දේව විනිශ්චයට මුහුණ දිය යුතුව තිබෙන බව මෙම මංගල්‍යයේ හරය වේ.

දෙව් මැදුරක්, කෙනෙකුට දෙවියන් හා මුසු වීමටත්, ජීවිතයේ අයහපත අතහැර යහපත කරා ගමන් කිරීමටත් සුදුසුම ස්ථානයකි. එහෙයින් ජීවිතය වෙනස් කරගැනීම සඳහා මෙම වාර්ෂික මංගල්‍යයත් එහි මධ්‍යස්ථානය වන්නා වූ දෙව් මැදුරත් දෙවියන්ගේ කාලයේ සළකුණු ලෙස වටහා ගන්න. මෙම මංගල්‍යයේ ආධ්‍යාත්මික කටයුතුවලට පණ පොවමින් ක්‍රියා කළ සැමටත් මීසම් වාසී ඔබ සැමටත් නොසිඳී ගලන දේව කරුණාව නිරතුරුව ම අත් වේවා! සුබ මංගල්‍යයක් වේවා!

ඔබට ක්‍රිස්තු තුමන් තුළ හිතැති,

කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්



# නව දෙව්මැදුරේ නිර්මාතෘවර අතිගරු මාකස් ෆර්ඩිනැන්ඩස් පියතුමන්ගේ සුභාශිංසන පණිවුඩය

පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ නව දෙව්මැදුරේ 30වැනි අභිමානවත් සංවත්සරය වෙනුවෙන් පළ කරනු ලබන විශේෂ සමරු කලාපයට පණිවුඩයක් ලබා දීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙමි. 1986 දී මා සමග එක්ව ක්‍රිස්තු රජාණන්ගේ නව දෙව්මැදුර ගොඩ නංවන්නට දායක වූ වැඩිහිටි, තරුණ, බාල, මීසම් වාසීන් සියලු දෙනාම ස්තූති පූර්වකව සිහිපත් කරමි.

1986 දී නව දෙව්මැදුරේ අභිෂේකය වෙනුවෙන් නිකුත් වූ සමරු කලාපයට මා ලබා දුන් පණිවුඩයේ ඇතුලත් වූ කරුණු කීපයක් නැවත මතක් කර දීමට කැමැත්තෙමි. "මීසමක හදවත දෙව්මැදුරයි. දේව ජනතාවට දහම් සාරයත්, සමිඳුන් වදනත් අර්ථාන්විත ලෙස තම ජීවිතයන් තුලින් විදහා දැක්වීමට රුකුල් දෙන කේන්ද්‍රීය ස්ථානය දෙව්මැදුර වේ. ක්‍රිස්තු රජාණන්ගේ සාමයත්, සැනසුමත් ලබා ගැනීමට හැකි වන්නේ දෙව්මැදුරට පැමිණීමෙනි."

ගෙවී ගිය 30 වසර තුල දී අප දෙව්මැදුරටත් එහි ජනතාවටත් කැප වූ සේවාවක් ලබා දුන් ගරු මීසම් සේවක පියවරුන් සහ සහයක පියවරුන් කෘතගුණවේදීව සිහිපත් කරමි. දෙව්මැදුරට සම්බන්ධ වූ, සම්බන්ධව සිටින මීසම්වාසීන්ට දේවාසිරි පතමි. ඔබ සියලු දෙනාම සමග එක්ව 30වැනි මංගල මහා දිව්‍ය පූජා යාගයට එක් වන්නට ලැබීම භාග්‍යයක් බැවින් මම දෙවිඳුන් පසසමි. ඔබට ක්‍රිස්තු රජාණන්ගේ ආශිර්වාදය නොඅඩුව ලැබේවා යනු මගේ යැදුම හා පැතුමයි.

**අති ගරු මාකස් ෆර්ඩිනැන්ඩස් පියතුමා**



# මීසම් සේවක පියතුමන්ගේ සුභාශිංසන පණිවුඩය

ජීවිතය පිළිබඳව දෙවරක් සිතන්නට අවස්ථාව ඉතා ගැඹුරින් ලැබෙන වාර්ෂික අවස්ථාවක් වෙතොත් එය ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය හැරුණු කොට වෙනත් දෙයක් නැති තරම් ය. එය එතරම්ම ගැඹුරු ය. එතරම්ම තීරණාත්මක ය. යමෙකුට වසරකට වරක්වත් ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යයට සහභාගී වීමට අවස්ථාව ලැබීමම දේවාශිර්වාදයක් ලෙස මට හැඟී යන්නේ, කිතුණු ජනවන්දනා වසරක අවසානයත් සමගම ජීවිතයක අවසානයක් මෙන්ම, නව ජීවිතයක ඇරඹුමක් දේව දර්ශනයේ වතට වත දැකීමත් සමගම ආරම්භ වන බැවිනි.

ගරු සකරියස් දබරේරා පියතුමා එක්දහස් නමසිය තිහේ දී, පොල්අතු මඩුවේ ආරම්භ කරන ලද අඩිතාලම, එක්දහස් නමසිය පනස් හයේ පන්නිපිටිය ස්වාධීන මීසමක් ලෙස ඇරඹූ නව දිවියට විසි වසරක් ගත වන කල්හි, එවකට මීසම් භාර එඩේරාණන් සිය අප්‍රතිහත ධෛර්යයෙන් එවකට මහරගම බොරලැස්ගමුව දේව ජනතාවගේ ද සහයෝගයෙන් අද දසක තුනක් සපිරෙන අප මහා දේව මාළිගාවේ ජීවයට ලැබුණු අත්වැල ඉතා ආදරයෙන් කෘතගුණවේදීව සිහිපත් කරමු. ක්‍රිස්තු රජාණන්ගේ රාජකීය මණ්ඩපයේ ඉදිකිරීම් විෂයෙහිලා මහරගම මච්චරුන්ගේ සංගමයේ පරිත්‍යාගය පිළිබඳව වත්මන් නිල මඩුල්ල හෝ අප මීසම් වාසීන් එතරම් අවබෝධයකින් සිටිනු ඇතැයි සිතීම උගහට ය.

අපගේ මීසම් ධර්මදූත හා ධර්මදාන කටයුතුවලදී දොමිනිකානු නිකායික ගරු පැවිදි කන්‍යා සොයුරියන් විශේෂ කොටගෙන, සුරදූතික නිකායික ගරු පැවිදි කන්‍යා සොහොයුරියන්ගේ සහය හා පිහිට මා හට නම් සැබවින්ම දේවාශිර්වාදයක්ම ය. එනමුදු බොහෝමයක් දේව ජනතාවට අමතක වී ඇතැයි සිතිය හැකි අපෝස්තලික කාර්මේල් ගරු පැවිදි කන්‍යා සොහොයුරියන් පන්නිපිටිය ළදරුවා මව් ඇකයේ හා තොටිල්ලේ සිටිය දී සිදුකර ඇතැයි සේ සැලකෙන කාර්යය භාරය අපට කෙසේ නම් අමතක කළ හැකිද? මේ කිසිදු දෙයක් චෝදනාවක් සේ නොසලකන්න. එය කරුණාවෙන් කරන ලෙස උදක්ම ආයාචනා කර සිටිමි. ඒ මන්දයත් මෙහිලා මා දැක්වූ කරුණු අත්දැක ගැනීමට තරම් විශාල පරාසයක කිතුණු ජනතාවක් ලෙස මීසම්වාසී ජනතාවක් නොසිටි බැවිනි. ඉතාමත් අල්පයක් වූ එවකට කිතුණු ජනතාවගේ ස්වර්ණමය මතක සටහනක් සේ පවතින මෙම සිදුවීම් පෙළ වර්තමානයේ ඔබට, මට මෙම සංවත්සරය මෙන්ම ඉතිහාසයේ මතක පිටු වැදගත් කාල පියසටහන්වල සංකේතාත්මක අවදියක් ලෙස කලඑළි බසිත්ම ඉතිහාසය යළි ආවර්ජනය කිරීම ඉතා අගනේය, හොබනේ ය.

ඉකුත්වන තවත් විසි වසරකින් ස්වර්ණ ජුබිලිය බිහිවේ. මතකය ඇසුරින් අප කළ කී දෑ දුහුවිල්ලක් වෙමින් සැබෑ රාජකීය තේජසින් හා ශ්‍රී විභූතියකින් මෙන් ම දේවාශිර්වාදය උතුරා ගලා යන ශුද්ධ වූ භූමියක් බවට පත්වී, වැඩි ජනතාවකට පිහිට හා සැනසීම ලැබෙන තෝතැන්නක් බවට පන්නිපිටිය, හෝකන්දර, හෝමාගම, රුක්මල්ගම, මත්තේගොඩ හා දික්හැතැක්ම දෙව් මැදුරු පත්වේවා! යන්න මගේ පැතුම ය. සඟරාවට පණිවුඩයක් ලබා දීමට කරන ලද ඇරයුමට ස්තුතිවන්ත වෙමින් ක්‍රිස්තුරජාණන්ගේ පිහිට මගින් යළි ඔබ මා කෙදිනක හෝ සමිඳු පාමුල එකතුවීමට වරම් ලැබේවා! කියා පතමි.

**ගරු ටිරොන් පෙරේරා පියතුමා**
මීසම් සේවක පියතුමා



# සහය මීසම් සේවක පියතුමන්ගේ සුභාශිංසන පණිවුඩය

අභිනවයෙන් ඉදිවූ ක්‍රිස්තුරජාණන්ගේ නව දෙව් මැදුරේ තිස්වන ජයන්ති උත්සවය සමරන්නට අපි සූදානම් වෙමින් සිටිමු. "ක්‍රිස්තු රජාණන්" යන වචන මාගේ සවනට වැටෙද්දී, මට මතක් වනුයේ "ක්‍රිස්තුස් වහන්සේගේ පරම ශ්‍රේෂ්ඨත්වය යි" ක්‍රිස්තුස් වහන්සේ අදෘශ්‍යමාන දෙවියන් වහන්සේගේ දෘෂ්‍යමාන ස්වරූපය වී මුළු මැව්ල්ලේ අගතැන් ගන්නා සේක. (කොලෝ : 1/15) මෙලොව ඇති සියල්ල ක්‍රිස්තුස්වහන්සේ සම්පූර්ණත්වයට පැමිණ ඇත. ඒ හෙයින් අප ජීවිත තුල උන්වහන්සේට අති සුවිශේෂම ස්ථානය අනිවාර්යයෙන් ම ලැබිය යුතුම ය.

පුරා වසර අසූපහකට අධික කාලයක් තුල ක්‍රිස්තුරජාණන්ගේ ආදරය හා මගපෙන්වීම තුල අපි පෝෂණය ලැබුවෙමු. සංඝයක් ලෙස ගොඩ නැගුනෙමු. මෙම මීසම මෙම තත්වයට ඔසවා තබන්නට ඇප කැප වෙමින් කටයුතු කරන ලද සියලුම ගරු මීසම් සේවක පියවරුන්, සහය මීසම් සේවක පියවරුන් මෙන්ම මීසමේ කටයුතු තමන්ගේ කටයුතු මෙන් මහත් ලැදියාවකින් යුතුව ඉෂ්ඨසිද්ධ කරන්නට නොයෙක් අයුරින් කැපවීම් කරන ලද ගිහි බාල, තරුණ, වැඩිහිටි සියළුම දෙනා මා මේ මොහොතේ සිහිපත් කරන්නේ හද පිරි ආදරයකිනි.

ආ මග කෙටි නමුත් යායුතු දුර ගමනක් අප ඉදිරියේ ඇත. බාධක, අවහිරතා, සිත් රිදවීම් මෙන් ම සිතට ජේසු සමිඳුන්ගේ ආදරය ආධ්‍යාත්මිකව අත්විඳින්නට, අත්දකින්නට ඔබට සිදුවනු ඇත. මෙයින් ජේසු සමිඳුන්ගේ ආදරය ආධ්‍යාත්මිකව අත්දකිමින් එම අසීමිත වූ ආදරය තම සංඝය සමග බෙදාගන්නටත් මේ ගමන තුළ ඔබට අත්විඳින්නට සිදුවන සෑම ගැහැටක් ම ස්වාමීන්වහන්සේගේ නාමයට ඔප්පු කරන්නටත් අවැසි ශුද්ධාත්ම වරම් ඔබට ලැබේවා යි මා ප්‍රාර්ථනා කරමි.

**ගරු ක්‍රිෂාන් ජයශාන්ත පියතුමා**
සහය මීසම් සේවක පියතුමා



# ධර්ම සේවා සභාවේ ලේකම් තුමන්ගේ සුභාසිංශනය

ධර්ම සේවා සභාවේ ලේකම් ලෙස නව ක්‍රිස්තුරාජ දෙව් මැදුර ඉදිකොට වසර 30ක් සපිරීම නිමිත්තෙන් නිකුත් කරනු ලබන සමරු කලාපය සඳහා සුභ පැතුමක් එක්කරන්නට ලැබීම මා සතු භාග්‍යයක් ලෙස සලකමි.

වසර 85කට අධික ඉතිහාසයකට උරුමකම් කියන පන්නිපිටිය කිතුනු ඉතිහාසය තුල ක්‍රිස්තියානිකම රැකගැනීම වෙනුවෙන් කැපවූ වැයවූ අය බොහොමයකි. ඒ සියලු දෙනාව ද මේ මොහොතේ මා සිහිපත් කරනුයේ හදපිරි ආදරයකිනි.

අදටත් දෙව්මැදුරේ සංවර්ධනය සඳහා කැපවී සිටින පිරිස අතර බොහෝමයක් පූජා උදව් දරුවන් ලෙස මෙම නව දෙව් මැදුරේ කටයුතුවලට සම්බන්ධ වූවන් වන අතර, එදා මෙදා තුර ගෙවී ගිය කාලයේ දී අඩු වැඩි වශයෙන් දෙව් මැදුරේ උන්නතිය උදෙසා කැපවන්නට හා වැයවන්නට අපට හැකියාව ලැබුණි. ඒ සඳහා බාල, තරුණ, වැඩිහිටි පිරිස් බොහොමයක් අප සමඟ අත්වැල් බැඳගන්නා ලදී.

ක්‍රිස්තුතුමන්ගේ අනුහස හා බලය පිළිබඳ සාක්ෂි දැරීම් අනන්ත අප්‍රමාණ ප්‍රමාණයක් අප සවන් වැකී ඇති අතර, අප දෙව් මැදුර කිතු හිමිතුමන් නමින් ම කැපවී තිබීම ද අප ලද වාසනාවකි.

අපේ දෙව් මැදුර තව තවත් චිරාත් කාලයක් ක්‍රිස්තුතුමන්ගේ බලපරාක්‍රමය විහිදවමින් වැජඹේවා! යි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරන අතර, මෙම සෑම කටයුත්තක් ම සාර්ථක කර ගැනීම සඳහා සහය වූ සැමට මාගේ හද පිරි ස්තූතිය පිරිනැමීමට ද මා මෙය අවස්ථාවක් කර ගනිමි.

**කොන්රඩ් ටිරෝන් ප්‍රනාන්දු**
ලේකම්
ධර්ම සේවා සභාව



# මීසම් සංවර්ධන කමිටුවේ සභාපතිතුමන්ගේ සුභාශිංසනය

"සමිඳානෝ ගෘහය නොහදත්නම්, මෙහෙකරුවෝ නිරපරාදේ වෙහෙසෙති" මීට වසර 86කට පෙර එනම් 1929 දී පන්නිපිටිය ග්‍රාමයේ පොල් අතු මඩුවක ක්‍රිස්තුරාජ දේවස්ථානයත්, ක්‍රිස්තුරාජ විද්‍යාලයත් සාදන අවස්ථාවේදී එය දෙවිඳුන්ගේ අභිමතය නොවුනිනම් වසර 86ක පමණ කාලයක් පිළිබඳ ඉතිහාසයක් පන්නිපිටිය මීසමට ඉතිරි නොවනු ඇත.

මඩුවකින් ඇරඹි දෙව් මැදුර අදවන විට පන්නිපිටිය ග්‍රාමය මධ්‍යයේ විරාජමානව වැඩසිටින්නේ දෙවිඳුන්ගේ බලපරාක්‍රමය දසත විහිදුවමිනි. පවුල් 1500කට ආසන්න ප්‍රමාණයක් පන්නිපිටිය මීසම වටා ගොනුවී සිටිති. හෝකන්දර, මත්තේගොඩ, හෝමාගම, දික්හැතැක්ම, රුක්මල්ගම යනාදී උප දේවස්ථාන පහක් පන්නිපිටිය මීසමේ මව් දෙව්මැදුර වන ක්‍රිස්තුරාජ දෙව් මැදුරින් පෝෂණය ලබති.

ගරු සකරියස් දබරේරා පියතුමන් විසින් අරඹන ලද ක්‍රිස්තුරාජ දෙව්මැදුර එදා මෙදා තුර පියවරුන් ගණනාවකගේ සේවයෙන් පෝෂණය ලබා ඇත. පූජක පක්ෂය මෙන්ම දේවස්ථානයේ උන්නතිය හා මීසමේ ප්‍රගතිය උදෙසා තම දහදිය, මහන්සිය, ශ්‍රමය, කුසලතා මෙන්ම මූල්‍යමය හා භෞතික සම්පත් මගින් දායකත්වය ලබා දුන් ගිහි පිරිසක් ද වෙති. ඒ අතර කුඩා දරුවාගේ සිට වැඩිහිටියන් දක්වා පරාසය තුල විහිදී ගිය බොහෝ දෙනෙක් වෙති.

අප සැමගේ මූලික අරමුණ වියයුත්තේ දේව රාජ්‍ය කරා පිය මනින දේව ජනතාවක් නිර්මාණය කිරීමත්, එකී දේව ජනතාව දෙවියන් වහන්සේ වෙතට තව තවත් ලංකිරීමත් ය. ඒ සඳහා ක්‍රිස්තුරාජ දේවස්ථානය, පන්නිපිටිය මීසම කදිම තෝතැන්නකි.

ක්‍රිස්තු රජාණන්ගේ උතුරා යන ප්‍රේමයෙන් ද, දේව තාත්තාගේ අපරිමිත දයානුකම්පිතභාවයෙන් හා ශුද්ධාත්මයාණන්ගේ මෙහෙයවීමෙන් ද, පන්නිපිටිය මීසමත්, ක්‍රිස්තුරාජ දේවස්ථානයත් කේන්ද්‍ර කරගනිමින් සමිඳුන්ගේ දේව සැලසුම ක්‍රියාත්මක කිරීමට සැමට වරම් ලැබේවා!

**නීතිඥ ලසන්ත මනෝජ් නානායක්කාර**
සභාපති
මීසම් සංවර්ධන කමිටුව

# අප ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැදුරේ ආරම්භය සමග බැඳුණ අසිරිමත් පුරාණය (1928 - 1986)



1986 වසරේ
ආසිරි ගන්වා විවෘත කිරීමට සූදානම්ව පැවති
ක්‍රිස්තු රජාණන්ගේ නව දෙව් මැදුර.

අප ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැදුර සඳහා මුල් අඩිතාලම වැටුණේ 1928 දී ය. ඒ වදා කෝට්ටේ මිසම් පාලනාධිපතිව සිටි ගරු සකරියස් දබරේරා පියතුමාගේ මූලිකත්වයෙනි. පන්නිපිටිය අවට විසූ රජයේ සේවක කතෝලිකයන් කීපදෙනෙකුගේ හා කිතුණු පවුල් කීපයක ඉල්ලීම මත, ඔවුන් සමග සාකච්ඡා කොට දිව්‍ය පූජාව පැවැත්වීම සඳහා ජන වන්දනා මධ්‍යස්ථානයක් පිහිටුවන්නට ගරු දබරේරා පියතුමා ක්‍රියාකාරී වූයේ ය. පියතුමාගේත්, කිතුණුවන් කණ්ඩායමේත් කැපවීම මත 1928 දී ප්‍රථම ජන වන්දනා මධ්‍යස්ථානය පන්නිපිටියේ පිහිටු වන ලදී. මෙම පළමු මධ්‍යස්ථානය මොරකැටිය පරණ පාරේ පෞද්ගලික නිවසක් වූ අතර, මසකට වතාවක් එහි දිව්‍ය පූජා මෙහෙය පමණක් සිදු කෙරිණ.

එතැන් සිට ක්‍රිස්තු රජාණන්ට කැප කෙරුණ කුඩා දෙව්මැදුරක ආරම්භය සහ ඉතිහාසගත සිහිවටන පෙළ මෙලෙස සටහන් වෙයි.

* 1928 - 30 කාලයේ එවකට අගරදගුරු හිමියන්ගේ ලේකම් වරයෙකු වූ ගරු පිලිෂියන් ප්‍රනාන්දු පියතුමා ගරු දබරේරා පියතුමාට සහය වෙමින් මාසයකට වතාවක් දිව්‍ය පූජාව සිදුකිරීම. පසුව දිව්‍ය පූජාව සිදු කළ ජන මධ්‍යස්ථානය වුණේ හෙන්රි ජේම්ස් මදනායක මහතාගේ නිවසයි.

* 1929දී ගරු දබරේරා පියතුමා සහ හෙන්රි ජේම්ස් මදනායක මහතා එක්ව මාරගහවත්ත නැමති භූමි භාගය ඇරැව්වල මාර්ගය අසලින් ලබාගැනීම.

* 1930 මාර්තු මාසයේ එම භූමි භාගයේ කුඩා දෙව්මැදුරක් තැනීමේ කටයුතු ආරම්භ වූ අතර අගෝස්තු මාසයේ නිම කිරීම. අපේ මුල්ම දෙව්මැදුර කුඩා පොල් අතු මඩුවකි. එය මසකට වරක් දිව්‍ය පූජාව පැවැත්වීමටත් සැදැහැවතුන් එක්තැන් කිරීමටත් මුල් විය.

* 1945 තෙක් පන්නිපිටිය කෝට්ටේ මීසමට අයත් වීම.



පොල් අතු මඩුවක් ලෙසින් බිහි වූ
අපගේ මුල්ම ක්‍රිස්තුරජාණන්ගේ දෙව්මැදුර.

* 1948 සිට පන්නිපිටිය මධ්‍යස්ථානය මීගොඩ දක්වා දීර්ඝ කොට කෝට්ටේ හා නුගේගොඩ මීසම යටතට පත් වීම.

* 1950 දී පළමුවරට අභිෂේක ආලේපය දානය කිරීම සහ අති උතුම් තෝමස් කුරේ අගරදගුරු හිමිපාණන්ගේ නිල චාරිකාව.

* 1930 - 55 සමයේ දී ගරු ජෝශප් ප්‍රනාන්දු, ගරු ජෝර්ජ්ස්, ගරු චාල්ස් රේමන්, ගරු ටිසොට්, ගරු ලිසි යන නිමල මරිය නිකායික පියවරුන්ගේ සේවාව,

  මේ සමයේ මහරගම ගුරු අභ්‍යාස විදුහලේ නේවාසික ගුරු මහත්ම මහත්මීන් සහ පනාගොඩ යුද හමුදා කඳවුරේ නේවාසික කිතුණුවන් ලබාදුන් දායකත්වය සිහිපත් කරමු.


* 1956 දී ගරු ඩබ්ලිව්. දොන් සිල්වෙස්ටර් පියතුමා පන්නිපිටිය මීසම් ගෘහයේ ස්ථිර පදිංචියට පැමිණීම. ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය උත්සවාකාරයෙන් පැවැත්වීම.

* 1958 දී අපෝස්තලික කාර්මෙල් කන්‍යා සොයුරියන්ගේ සේවාව මහරගම කන්‍යාරාමයේ ඇරැඹීම. 1961 සිට 1970 දක්වා ප්‍රැන්සිස්කන් නිකායික සොහොයුරන්ගේ සේවය පන්නිපිටිය දෙව්මැදුර කේන්ද්‍රීය කරගනිමින් පවත්වාගෙ යාම. දොන් බොස්කෝ නමින් කාර්මික ආයතනයක් ක්‍රියාත්මක කිරීම.

* 1959 දී පන්නිපිටිය නව මීසමක් ලෙස පිළිගැනී සහ ගරු දොන් සිල්වෙස්ටර් පියතුමා පළ මීසම් සේවක ලෙස පත්වීම. පන්නිපිටිය මහරගම සහ හෝමාගම නව මීසමට අයත් වීම පනාගොඩ ප්‍රදේශය සහ මහරගම ගුරු අභ්‍යා විද්‍යාලය ද මීටම අයත් විය.

* 1974 දී දොමිනිකාන නිකායික සොහොයුරිය පන්නිපිටියට පැමිණීම. 1975 සිට ක්‍රිස්තුරා විද්‍යාලය ඔවුන් යටතේ පාලනය වීම.

1984 දී මුල්ගල් තබා 1986 දී ක්‍රිස්තුරජාණන් කැප කළ අප නව දෙව්මැදුර ගොඩනැගුණේ ගරු මාකස් ෆර්ඩිනන්ඩ්ස් පියතුමාගේ සමයේ දී ය. එදා ධර් සේවා සංගමයේ ලේකම්වරයා ලෙස දෙව්මැදුර ගො නංවන්නට පියතුමා කළ කැපවීම, ආත්ම ධෛර්ය දෙවිඳුන් තුල විශ්වාසය සහ මීසම් සංඝය එකමුතු ක ආකාරය හොඳින් දුටුවෙමි. අදටත් එතුමාගේ හදව අප දෙව්මැදුර සමගය. ඉඳහිට මෙහි පැමිණි වි දෙව්මැදුරට ගොස් යාච්ඤා කරන්නට, දෙව්මැදුර ප බැඳි පුරාණ තතු කතා කරන්නට එතුමා අමත කරන්නේ නැත. දිගු සේවා අත්දැකීම් මාලාවක් සම අද මොරටුව උයන දෙව්මැදුරේ සේවය කරන අ පියතුමාට නිරෝගී සුවය සමග දේවාසිරි පතමු.



පැරණි ස්ථිර දෙව් මැදුරේ මුල් අඩියර



පැරණි ක්‍රිස්තුරජාණන්ගේ දෙව් මැදුර
ඉදිකිරීම් වැඩ කටයුතු අවසන් වීමෙන් පසු...

අප මීසම් පවුල තුලින් සම්බුදුන් මිදි උයනේ සේවය සඳහා කැපව සිටින ගරු පියතුමන්ලා සහ ගරු කන්‍යා සොහොයුරියන් දැනට සේවය කරන මධ්‍යස්ථාන මෙලෙසිනි.

* ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමා
  (එක්සත් ජනපදය - නිව්යෝක්)

* ගරු ප්‍රියන්ත සිල්වා පියතුමා
  (ක්‍රිස්තියානි කලාව සහ වාස්තු විද්‍යාව පිලිබඳ අගදරගුරු කේන්ද්‍රය - අධ්‍යක්ෂක)

* ගරු ජූඩ් ශ්‍යාමන් ප්‍රනාන්දු පියතුමා
  (ඉදිගොල්ල සිද්ධස්ථාන පරිපාලක)

* ගරු ඩිලාන් ජෑන්ස් පියතුමා
  (කොළඹ සාන්ත ජෝසප් විද්‍යාලය)

* අපෝස්තලික කාර්මෙල් සොහොයුරියන්

  ගරු එල්මා පෙරේරා කන්‍යා සොහොයුරිය (පුස්සැල්ලාව)

  ගරු දූතිකා පෙරේරා කන්‍යා සොහොයුරිය (මග්ගොන)

**බැතියෙන් සිහිපත් කරමු -**

පැරණි ක්‍රිස්තුරජාණන්ගේ දෙව්මැදුර සහ ක්‍රිස්තුරාජ විද්‍යාලය පිහිටි භූමිභාගය ලබා දෙමින් ගරු සකරියස් දබරේරා පියතුමන් හා එක්ව අමිල සේවාවක් කළ හෙන්රි ජේම්ස් මදනායක මහතාණන් සහ දුර බැහැරින් පැමිණ සැබෑ කැපවීමකින් යුතුව අමරණීය සේවාවක් කළ ඩබ්ලිව්. ජේ. පෙරේරා මහත්මිය (මිස් පෙරේරා)

**සගසෙත් පතමු -**

මීසමේ නිර්මාතෘවර ගරු සකරියස් දබරේරා පියතුමා, ගරු ඩබ්ලිව්. දොන් සිල්වෙස්ටර් පියතුමා (පසුව ගාලු රදගුරු හිමි), ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා, ගරු ආතර් එදිරිවික්‍රම පියතුමා සහ ගරු ජේ. මිකර් පියතුමාට සදාතනික මොක් සුව පතමු.

එලෙස ම පුරෝගාමී දූත සේවාවෙන් සහ දහම් ලැදියෙන් නොමියෙන සේවාවක් කොට අප අතරින් වියෝ වූ ගිහි නායක නායිකාවන් සැමටත් සග සෙත් පතමු.

මා සමග පන්නිපිටිය මීසම් පුරාණයට අයත් තොරතුරු රැස් කරන්නට වෙහෙසුන ජෙරාඩ් ප්‍රනාන්දු මහතා (හිටපු උප විදුහල්පති - ක්‍රිස්තුරාජ විද්‍යාලය), මියුලන් සපරමාදු මහතා (නැසීගිය ප්‍රවීන ලේඛක) සහ නෝබට් මනතුංග මහතා (නැසීගිය ප්‍රවීන ලේඛක) විශේෂයෙන් සිහිපත් කරමු.

**ක්‍රිස්ටෝපර් රණසිංහ**
ප්‍රවීන ආචාර්ය - මාධ්‍යවේදී සහ ලේඛක

# දෙව්මැදුර ගොඩනංවන්නට දායක වූ වැඩිහිටි, තරුණ ගිහි කණ්ඩායම

ක්‍රිස්තු රජාණන්ගේ නව දෙව්මැදුර ආසිරි ගැන්වුණේ 1986දී ය. මෙම අසිරිමත් අවස්ථාව උදා වූයේ නොවැම්බර් මාසයේ ක්‍රිස්තු රජාණන්ගේ මංගල්ලයය දින එවකට අගරදගුරුව සිටි අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වෙයනි. අගරදගුරු හිමිපාණන්ට ඇරැයුම් කළේ නව දෙව්මැදුරේ නිර්මාතෘවරයා වන ගරු මාකස් ෆර්ඩිනන්ඩ්ස් පියතුමා ය.

නව දෙව්මැදුර තනන්නට මුල්ගල තැබුණේ 1984 දී ය. එදා එම මොහොතට ප්‍රධානත්වය ගත්තේ අගරදගුරු පදවියේ අනුනායකවරයෙකු වූ අතිගරු ජේමන්ඩ් පීරිස් පියතුමාය. මුල්ගල තැබුණ දිනත් නව දෙව්මැදුර ආසිරි ගැන්වුණ දිනත් විශාල පිරිසක් බැතිබරව ඊට එක් වූහ.

දෙව්මැදුර ගොඩනැංවීම පියවරෙන් පියවර සම්පාදනය කරන්නට ගරු මාකස් ෆර්ඩිනන්ඩ්ස් පියතුමාට සහය දැක්වූ මීසම් සභාවේ උද්‍යෝගිමත් කණ්ඩායමක් සිටියේය. ඒ අපේ වැඩිහිටි හා තරුණ පිරිසවේ. අවශ්‍ය ශ්‍රමදාන සංවිධානය කරන්නට, බඩු බාහිර ආදිය සපයන්නට, කෑම බීම සම්පාදනය කරන්නට, මුදල් සපයා දෙන්නට මේ කණ්ඩායම කඩිසරව කටයුතු කළ ආකාරය තාමත් අපට මතක ය.

මේ කණ්ඩායමේ සිටි කිහිපදෙනෙකු අද ජීවතුන් අතර නැත. 30 වැනි සංවත්සරය සමරන මේ ප්‍රීතිජනක අවස්ථාවේ මේ ගිහියන් පිරිස ස්තූති පූර්වකව සිහිපත් කරමු.

පන්නිපිටිය මීසම් ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන මේ ගිහියන් කණ්ඩායම මෙලෙසිනි. නෝබට් මනතුංග, ග්‍රෙගරි ජෝශප්, ජෙරි සුරවීර, පාලිත අබේවික්‍රම, ජෙරි සිල්වා, සරත් මුදලිගේ, පෝල් සිල්වා, මියුලන් සපරමාදු, බ්‍රයන් පෙරේරා, වසන්ත රණසිංහ, පීටර් ප්‍රනාන්දු, සී. රොඩ්රිගෝ, ක්‍රිස්ටෝපර් රණසිංහ (ධර්මසේවා සභාවේ ලේකම්), ග්‍රේස් එදිරිසිංහ, කොන්සි පැල්පොල, රෝස් මුදලිගේ, ඩී. එස්. ආර්. මුදලිගේ, ලෝනා පෙරේරා, සීතා මෙන්ඩිස්, ඩොරිස් පෙරේරා, තෙල්මා මදනායක, රංජනි සුරවීර, එස්. එච්. එන්. ද සිල්වා, ක්‍රිශාන්ත මනතුංග, ශිරන්ත මනතු[ංග]
යන අය වේ.

එදා තරුණ කණ්ඩායම : රෙක්ස් ආදිහෙට්ටි[,] ඇනස්ටා පෙරේරා, ලිලන්ත සුබසිංහ, කාලෝ සුබසිංහ, ඇන්තනි කරුණාරත්න, එම්මානුවෙල් සෙබස්තියන්, මැක්සි ආදිහෙට්ටි, ඇන්තනි ෆර්ඩිනන්ඩ්ස්, ඩෙස්මන් ලුවිස්, රෝහන අමරසේකර[,] ජිම් ජේට්, ක්‍රිශාන්ත ප්‍රනාන්දු ඇතුලු තරුණ කණ්ඩායම.

දෙව්මැදුර ආසිරි ගැන්වීමේ මෙහෙය පවත්[...] ලැබුවේ, අගරදගුරු හිමිපාණන් ප්‍රමුඛ ගරු පියවර[...] කණ්ඩායමක් විසිනි. රත්මල්දෙනිය විහාරස්ථාන[...] විහාරාධිපතිව වැඩ හුන් පූජ්‍ය ජිනසිරි නායක හිමිය[...] මොරකැටිය විහාරස්ථානයේ විහාරාධිපති පූ[...] කොට්ටාව ප්‍රේමරතන හිමියන් කැස්බෑව පාර්ලිමේ[...] මන්ත්‍රී ගාමිණි ලෝකුගේ, වෛද්‍ය ගාමිණී විජේසේ[...] ඇතුලු සම්භාවනීය අමුත්තන් පිරිසක් ද පැ[...] සිටියහ. දෙව්මැදුර ගොඩ නැංවීමේ දී ගරු පො[...] පෙරේරා සහ ගරු කැතරින් ඇන්තනී ක[...] සොහොයුරියන් වෙතින් ලැබුණ සහයත් ඉතා අගය [...] යුතු වේ.

---

**ක්‍රිස්ටෝපර් රණසිංහ**
ප්‍රවීන ආචාර්ය - මාධ්‍යවේදී සහ ලේඛක

> *ඔබේ ඉරණම හිමිතුමන්ට භාර දෙන්න;*
>
> *එතුමන් කෙරෙහි විශ්වාසය තබන්න;*
>
> *හිමිතුමන් හැම දෙය ඉටුකර දෙනු ඇත.*
>
> *හිමිතුමන් ඔබේ යහපත්කම ඉර එළිය මෙන් [...]*
>
> *ඔබේ දැහැමිකම මද්දහන මෙන් ද*
>
> *බබළවන සේක...*
>
> ගීතාවලිය - 37 : 5 - 6

# පන්නිපිටිය ක්‍රිස්තුරාජ නව දේවස්ථානයේ නිර්මාතෘවරයාණෝ වසර 29කට පසු සිය හඬ අවදි කරයි.

## අතිගරු මාකස් ෆර්ඩිනැන්ඩස් පියතුමා කිතුමිණ පුවත් සඟරාව වෙනුවෙන් සිදුකළ සංවාදයක් ඇසුරිනි.



**ඔබවහන්සේ පන්නිපිටිය මීසමට ආවේ කොයි කාල වකවානුවේද?**

මීසමට ආවේ 1982. මට මතක විදිහට ඒ දවස්වල පූජක මාරුවීම් තිබුනේ අගෝස්තු මාසේ.

එයට පෙර ඔබවහන්සේ සිටියෙ, සේවය කළේ කොහේද?

මම පන්නිපිටියට එන්න කලින් සේවය කළේ නුගේගොඩ මීසමේ.

**ඔබවහන්සේ පන්නිපිටිය මීසමේ වගකීම භාරගන්නකොට පන්නිපිටිය මීසමේ තත්ත්වය කොහොමද?**

පන්නිපිටිය මීසම, පදවිය තුළ ගත්තොත් "ධර්මදූත මීසම්" ඉංග්‍රීසියෙන් කියන්නේ "Missionary areas" කියලා කියන්නේ අන්න ඒ වර්ගයට තමයි පන්නිපිටිය ඇතුළත් වෙලා තිබ්බේ. ප්‍රධාන වශයෙන් මතුගම, අවිස්සාවේල්ල, පන්නිපිටිය කියන මීසම් තුන මේ වර්ගයට අයිති වෙලා තිබුණා. ප්‍රදේශය වැඩියි, නමුත් ජනතාව අඩුයි. ඒක විශේෂ ලක්ෂණයක් මේ ධර්මදූත මීසම්වල. ඒත් එක්කම අගරදගුරු පදවියෙ භූගෝලීය වශයෙන් ලොකුම මීසම් තුනත් මේවා තමයි.

ඒ වගේම දැන් තියෙන පහසුකම් පන්නිපිටියෙ තිබුණේ නැහැ. දේවස්ථානය විදිහට තිබුණේ පන්ති කාමර වගේ ස්ථානයක්. බිත්ති බාගෙට බැඳල තිබුණෙ ගොඩනැගිල්ල. එතකොට මීසම් ගෘහය වුනේ පාසලේ පරණ මොන්ටිසෝරිය පහළ තිබෙන කොටස. එහෙම තමයි පටන් ගත්තේ අපි.

එතකොට මට මතක විදිහට සිස්ටර්ස්ලට හිටියෙ සිස්ටර් පොලින්, සිස්ටර් ඇග්නස් සහ සිස්ටර් කැතරින්. මම එන්න වසර කීපයකට කලින් සිස්ටර්ස්ල ඇවිත් හිටිය. මට කලින් හිටියෙ ගරු ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා.

**කවුද එවකට ඔබවහන්සේගේ උදව්වට ආපු සහය මීසම් සේවක පියතුමන්ලා?**

මම 1982 ඇවිත් 1990 වෙනකල්ම හිටියා අවුරුදු 08ක්. මට සහයක පියතුමෙක් හම්බවුනේ 1986 දී. රොබින්සන් පියතුමා තමයි පළවෙනි සහය මීසම් සේවක පියතුමා විදිහට පන්නිපිටියට ආවේ. ඒ වෙනකල් අවුරුදු 04ක් මම තනියම වැඩ කළේ.

**පන්නිපිටිය ක්‍රිස්තුරාජ දේවස්ථානය හදන්න අදහස ආවේ කොහොමද? කවුද මගපෙන්නුවේ?**

මම පන්නිපිටියට එන්න ඉස්සෙල්ල ඉඳන්ම දේවස්ථානයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය පන්නිපිටියෙ ඇතිවෙලා තිබුණා. මොකද මම කලින් කිව්ව වගේ දේවස්ථානය, දේවස්ථානයක් විදිහට

නෙමෙයි තිබුණේ. ඉතිං ඒ අවශ්‍යතාවය තිබුණා. ශක්තිමත් විශාල දේවස්ථානයක අවශ්‍යතාව ඉස්මතු වෙලා තිබුණා. පවුල් සංඛ්‍යාව වැඩිවෙලා තිබුණා. ඉතිං මිනිස්සුන්ගේ ලොකු ඕනකමක් තිබුණා දේවස්ථානයක් ගොඩනැගීමට.

**දේවස්ථානය හදන්න මුලින්ම තීරණය කළේ අද තියෙන ස්ථානයේද?**

මම එනකොට දේවස්ථානය හදන්න ඕන කියන උද්යෝගය මිනිස්සු තුළ බොහොම ඉහලින් තිබුණා. නමුත් ඔතන යම් යම් ප්‍රශ්නත් තිබුණා. පාසලයි දේවස්ථානයයි. සමහර අය කිව්වා දැන් ඔය පිට්ටනිය තියෙන තැන දේවස්ථානය හදන්න ඕන කියල. තවත් සමහර අය කිව්ව දැන් තියෙන තැන හොඳයි කියල. දැන් තියෙන තැන විශාල දේවස්ථානයක් හදන්න පුලුවන්ද කියන ප්‍රශ්නෙත් තිබුණා. ඉතිං ඔය සම්බන්ධව විද්‍යාලයයි දේවස්ථානයයි අතර පොඩි මත ගැටුමක් තිබ්බ. ඒ හේතුවෙන් ටිකක් ප්‍රමාද උනා දේවස්ථානයේ වැඩකටයුතු ආරම්භ කරන්න. මම ආවට පස්සේ මිනිස්සු මට ඇවිත් මේ ගැන කථාකරා. මම ඇත්තට ම එන්න කලින් මේ තත්ත්වය දැනගෙනයි හිටියෙ. මම කිව්වා මිනිස්සුන්ට ඔයාලා අගරදගුරුතුමන්ගෙන් අහල තැන තීරණය කරල මට කියන්න එතකොට මම වැඩ පටන් ගන්නම් කියල.

**දේවස්ථානයක් හදන එක ලොකු අභියෝගයක්?**

ඔව් ඒක ලොකු අභියෝගයක්, ප්‍රථමයෙන් ම තැන තෝරගන්න එක තමයි ලොකුම අභියෝගය වුනේ. මිනිස්සු එක දෙයක් කියනව, පාසල තව දෙයක් කියනව. ඉතිං ඒකත් අභියෝගයක් වුනා. ඔක්කොම කතෝලිකයොනේ, සභාවේ කට්ටියනේ. ඉතිං එතන පොඩි මතභේදයක් තිබුණා. හැබැයි අපිට පුළුවන් වුනා ඒවා කථාකරලා බේරගන්න.

මම අගරදගුරුතුමන්ට කිව්වා ඔබවහන්සේලා ඇවිල්ල තීරණයක් ගන්න මට බැහැ මේ සම්බන්ධයෙන් තීරණය කරන්න කියල.

දවසක් එවකට හිටපු අගරදගුරු අතිඋතුම් නිකලස් මාකස් හිමිපාණන්, භාණ්ඩාගාරික පියතුමා, ලේකම් පියතුමා ඔහොම හතරදෙනෙක් ආවා මට මතකයි. එවකට සහය රදගුරු හැටියට හිටපු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණනුත් ආවා. ඇවිත් තීරණය කරා දැන් තියෙන තැන. ඔතන එතකොට තිබ්බෙ කන්‍යාරාමය. එතන අපි කව්රුත් හිතපු තැනක් නෙමෙයි. අපි සභා ශ්‍රේෂ්ඨයන්ගේ අණට කීකරු වෙන්න ඕනනේ. ඉතින් අපි ඒ තීරණයට ආව.

**ක්‍රිස්තුරජාණන්ගේ දේවස්ථානය මේ අද තියෙ ස්ථානයේ හදන එක තමයි දේව කැමැත්ත කිය කොහොමද නිගමනය කළේ?**

ඒක මට හරියට ම කියන්න බැහැ. අවසානයේ අපි හිතන්නේ එහෙමනේ. මොකද සභා ශ්‍රේෂ්ඨයනු මැදිහත් වෙලා තමයි මේ ස්ථානය තීරණය කළේ.

**දේවස්ථානය සෑදීම ආරම්භ කරන්න කලින් ඒ සඳහ ආධ්‍යාත්මික සූදානමක් වුනාද? ඒ කොහොමද?**

මට එහෙම නිශ්චිත මතකයක් නැහැ. හැබැ දේවස්ථානයේ අවශ්‍යතාවය මිනිස්සුන්ට දැණුනා. ඒ අ ගොඩක් යාච්ඤා කරා. පවුල් වශයෙන් ජපමා උච්චාරණය කරා. විශේෂයෙන්ම පාද නමස්කාර සිදුකරා මට මතක විදිහට.

**දේවස්ථානයේ සැලසුම සකස් කිරීමේ කටයුතු කො විදිහටද සිද්ධ වුනේ?**

අපි මුලින්ම කල්පනා කළේ ඉඩම ගැන. ඉඩ පර්චස් 80 ක් තියෙනව. ඔය පර්චස් 80වේ තම දේවස්ථානයයි, සීනු කුඩුවක් හදනවනම් ඒකයි, මීස ගෘහයක් හදන එකයි සියල්ලම කරන්න තියෙන්නේ.

අපි ඉතිං සැලසුම ඇන්ද ඔය විදිහට මොකද වෙ විකල්පයක් නැහැ. පළල වැඩිකරල උපරිම විදිහ ගත්තට දිගින් වැඩිකරන්න බැහැ. පාර මැද්දෙ ඉද අඩි 40 ක් තියන්න උනා දේවස්ථානයට. පාර පළ වුනොත් බලපෑමක් නැතිවෙන්න. ඉතින් ඒ නිසා උපරි පළල ගත්තා මායිම් වෙනකල්ම වගේ. ඉඩමේ හැ උපරිමයෙන් පාවිච්චි කරන්න වුනා අපිට. ඉති දේවස්ථානයයි, මීසම් ගෘහයයි දෙකටම එකටම තම සොන්ඩර්ස් මහත්මයා සැලසුම ඇන්දේ. මීසම් ගෘහ තට්ටු දෙකකටයි සැලසුම් කරේ. ඔය දැන් සීනු කුඩු තියෙන්නේ එතන තමයි.

හොඳ වෙලාවට ඔය දැන් මීසම් ගෘහය තියෙ තැන තිබුන ගේ හිස් උනා. ඒකෙන් මීසම් ගෘහය හද එක අතහැරල දැම්ම. කොහොමත් මීසම ගෘහය සැලසුම් ඇන්දට අපේ අරමුණ ඉලක්කය වුෙ දේවස්ථානය ගොඩනගන එක. අපි දේවස්ථානයේ වැ පටන් ගත්ත. එතකොට සිස්ටර්ස්ලට තැනක් දෙන් ඕනනේ ඒ අය ඉන්න තැන කැඩෙනවනේ. ඒ නිසා සභා ගත්ත දැන් කන්‍යාරාමය තියෙන තැන සිස්ටර්ස් එතනට ගියා. මම ටික දවසක් හිටපු තැනම ඉද සිස්ටර්ස්ල කලින් හිටපු තැන භාගෙට කඩල එත ඉතිරි වෙලා තිබුණ කොටසේ පදිංචි උනා. ඔහො

පල්ලිය හදාගෙන යනකොට ඔය දැන් තියෙන මීසම් ගෘහය තියෙන ගේ හිස් උනා. සිස්ටර්ස්ල එතන හිටියා. පස්සේ සිස්ටර්ස්ල දැන් ඉන්න තැනට ගියා. මම අළුත් තැනට ආවා.

**කවුද සභාව පැත්තෙන් ඔබවහන්සේ එක්ක සහයට හිටියේ දේවස්ථානය ගොඩනගන ක්‍රියාවලියේදී?**

මට අමතක කරන්නම බැරි අති උතුම් එඩ්මන්ඩ් ෆේමන්ඩ් පීරිස් හිමිපාණන්. එතුමා කොටහේනේ මීසම් සේවක වෙලා ඉන්නකොට මම සහයක පියතුමා විදිහට හිටියා. මම අවුරුදු 4ක් එතුමා එක්ක හිටියා. ඊට පස්සේ උන්නාන්සේ අනුනායක උනා. මම උන්නාන්සේට කිව්ව මේ දේවස්ථානය හදන්න මට උදව් කරන්න කියල. මට මතක විදිහට ඒ වෙනකොට උන්වහන්සේ භාණ්ඩාගාරික පියතුමා. ඒ වගේම උන්නාන්සේ ගොඩාක් උදව් කළා.

**මොනවද ඔබවහන්සේ මුහුණ දීපු අභියෝග මේ වැඩේදී?**

අභියෝග රාශියක් තිබුණා. විශේෂයෙන් ම සැලසුම අනුමත කරගන්න එක ලොකු අභියෝගයක් උනා. මොකද අපි පන්නිපිටිය දේවස්ථානය හදන්න පටන් ගත්තේ මහරගම දේවස්ථානය හැදුවට පස්සේ මහරගම දේවස්ථානය හදනකොට ගරු ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමාට සෑහෙන තර්ජන මරණීය තර්ජන පවා සිද්ධ වෙලා තිබුණා. ඉතිං ඒ පසුබිම තුළ තමයි පන්නිපිටිය දේවස්ථානය ඉදිකිරීම ආරම්භ කළේ. එතකොට අපිට බියක් තිබුණා සමහර පිරිස් ගැන. නමුත් වාසනාවකට ගමේ බෞද්ධ භික්ෂූන්වහන්සේලා අපිත් එක්ක සුහදව හිටිය.

ඇඳපු සැලසුම් අතින් අත යන්න අපි ඉඩතිබ්බේ නැහැ. හැම තැනකටම මමමයි ගියේ. මම මතක් කරන්න ඕනේ සිස්ටර් පොලින්ව. එතුමියත් මගෙත් එක්කම හිටිය මේ වැඩේදි. ප්‍රාදේශීය සභාවේ හිටපු නිලධාරීන් අපිට ගොඩාක් උදව් කළා. කොහොම හරි අපි සැලසුම අනුමත කරගෙන ඉදකිරීම් ආරම්භ කළා.

මම ෆේමන්ඩ් පීරිස් පියතුමාට කිව්ව ඔබවහන්සේ මට වහලට විතරක් උදව් කරන්න කියල. උන්වහන්සේ අපිට ඒ කාලේ ලක්ෂ 3 1/2 ක් දුන්නා. මගේ අදහස තිබුණේ කණු නග්ගල වහල ගහගන්න. මොකද අපිට ලී දඬු, කොස් ගස් එහෙම මීසමේ සැදැහැවතුන් දුන්න. මට මතකයි අපි අලියෙක් අරන් ගිහින් තමයි කඳන් ඇද්දේ.

මට මතකයි එක අවස්ථාවක්, මේ කොස් දැව ප්‍රවාහනය කරන්නේ අපිට අවසර දීලා තියෙන යම් නිශ්චිත වෙලාවක් ඇතුළත. අපි කථා කරලා තිබ්බ ලොරියෙ රියදුරා එහෙම ප්‍රවාහනය කරන්න නියමිතව තිබුණ දවසට කලින් දවසේ වෙන මොකක්ද වරදකට පොලිසියෙන් රිමාන්ඩ් කරල. දැන් අපිට කරගන්න දෙයක් නැතුව ඉන්නකොට එතකොට හිටිය ඒ. එස්. පී. කෙනෙක් දෙල්ගොඩ කියල එයා කතෝලික කෙනෙක්. එයා කොහොම හරි කථාකරල මෙ ප්‍රවාහනය කරන්න අවසර දීලා තිබුණ වෙලාවට රියදුරාව නිදහස් කරල දුන්න. ඔය වගේ රසවත් සිද්ධි අභියෝග රාශියක් මේ කාලයේදී අපි අත්දැක්ක.

**ඇදවැටුන තැන්, පසුබැස්ස තැන්, කලකිරුණ තැන් ගොඩක් තියෙනව ඇති දේවස්ථානය හදන ක්‍රියාවලියෙදී?**

ඇත්තටම අපි හිරවුණේ ගොඩක් වෙලාවට මුදල් පැත්තෙන්. මොකද අපි වැඩක් පටගන්නේ ඕන කරන සියලුම මුදල් අතේ තියාගෙන නෙමෙයිනේ. විශ්වාසෙන් තමයි අපි වැඩේ ආරම්භ කරන්නේ. නමුත් මේක ඉවරකරගන්න පුළුවන් වෙයිද කියල බියක් මගේ හිතේ තිබුණා.

**දේව සංරක්ෂණය අත්දැක්කද දේවස්ථානය හදන ව්‍යාපෘතියේදී. කොයි විදිහටද දෙවියන්වහන්සේ අත්දැක්කේ?**



අපි දේවස්ථානයට මුල්ගල තැබුවේ 1984 දෙසැම්බර්. අපි දෙසැම්බර් මුල්ගල තිබ්බට වැඩ පටන්ගත්තේ නැහැ. ආගමන කාලේ, නත්තල් ඔය වගේ දේවල් නිසා අපි වැඩ පටන් ගත්තේ 1985 ජනවාරි මාසේ. දේවස්ථානය හදල ඉවර කළේ 1986, අවුරුදු එකහමාරකින් කණු, වහල විතරක් නෙමෙයි සම්පූර්ණ දේවස්ථානය ගොඩනගල ඉහළ තියෙන නියොන් ලයිට් කුරුසය පවා දාලා අවසන් කරන්න අපිට පුළුවන් වුණා. මම දැඩිව ම විශ්වාස කරනව අපිට එහෙම කරන්න පුළුවන් උනේ දේව සංරක්ෂණය තුළ කියල. ක්‍රිස්තු රජාණෝ අපිට උදව් කරා.


ඒ වගේම මිනිස්සු තුළ ලොකු එකමුතුකමක්, උද්‍යෝගයක් තිබ්බ. මම හිතන්නේ ඒවා උනත් දෙවියන්ගේ මගපෙන්වීම තුළ සිද්ධ උන දේවල් කියල. මට ඇත්තට ම මේ දෙව්මැදුර සම්පූර්ණ ලෙස ගොඩනගල අවසන් කරා කියන එක ප්‍රාතිහාර්යයක්. මොකද මම කලින් කිව්ව වගේ මම උත්සහ කරේ කණු නග්ගල වහල ගහන්න. හැබැයි හැම දෙයක් ම අංග සම්පූර්ණව අවසන් කරන්න අපිට පුළුවන් වුණා.

අනිත් වැදගත් ම කාර්ය තමයි ක්‍රිස්තුරජාණන්ගේ දේවස්ථානයේ අල්තාරය බෙන්සාරු කරල නෙමෙයි තියෙන්නේ. අභිෂේක කරල තියෙන්නේ. බෙන්සාරු කිරීමයි අභිෂේක කිරීමයි අතර ලොකු වෙනසක් තියෙනව. ඒ හේතුව නිසාමයි අල්තාරය ලීවලින් හදන්නේ නැතුව කළුගල්වලින් සෑදුවේ. ඒක සභා නීතියෙ එන දෙයක්. ප්‍රදේශයේ එහෙම අභිෂේක කරපු දේවස්ථානවලින් පළවෙනි දේවස්ථානය ක්‍රිස්තුරාජ දේවස්ථානයයි. ඒ වගේ ම අභිෂේකයට ආපු අගරදගුරුතුමා ඇහුව ඔබතුමා කියන්න කොහොමද කියල මේකට මුදල් හොයාගත්තේ. මොකද උන්නාන්සේලාටත් පුදුමයි කොහොමද මේක මේ විදිහට කරගත්තේ කියල.

**වැඩක් කරනකොට උදව් කරන පිරිස් වගේ ම කකුලෙන් අදින අය ගොඩක් ඉන්නව. දෙවියන්ගේ වැඩේ කියල වෙනසක් නැහැ. එහෙම අත්දැකීම් තියෙනවද. ක්‍රිස්තුරාජ දේවස්ථානය ගොඩනගනකොට?**

සංසයක් වශයෙන් නැහැ මගේ හිතේ. නමුත් පිටස්තර අය හිටිය හැබැයි එයාලත් ප්‍රසිද්ධියේ ආවෙ නැහැ. ඒත් අපිට තේරුණා යම් යම් බලවේග ක්‍රියාත්මක වෙනව කියල.

**දේවස්ථානයක් ගොඩනගනව කියන්නේ පහසු වැඩක් නෙමෙයි. අදටත් වඩා එදා ඒක අසීරු කාර්යයක්. මේ වගකීම ඔබට පැවරුනහම ඔබට මොනවද හිතුනේ?**



යුගයක් එකළු කළ නායකත්වයන් දෙකක හමුවක්

මට ඇත්තටම හරිම සංතෝෂයක් දැනු දෙවියන් වහන්සේ වෙනුවෙන් මන්දිරයක් ගොඩනග ලැබීම වාසනාවක්. සමහර ස්වාමිල ඉන්නව මීසම් වැඩකරල යනව විතරයි. මට ඊට වඩා වැඩි කාර්යය දෙවියන්වහන්සේ දුන්නා. පන්නිපිටියේ ක්‍රිස්තු දේවස්ථානය විතරක් නෙමෙයි දේවස්ථාන කීපය පන්නිපිටිය මීසමේ ගොඩනගන්න වරප්‍රසාදයක් දුන් ඒක ඇත්ත වශයෙන් ම භාග්‍යයක් හැටියටයි විශ්වාස කරන්නේ.

**පූජක නායකත්වය ඔබවහන්සේ දෙනකොට කාර්යයට ගිහි නායකත්වයකුත් අනිවාර්යයෙ ලැබෙන්න ඇති. මතකද ඔබවහන්සේට ඒ කණ්ඩා කව්ද කියල?**

ඇත්තටම ගිහි නායකත්වය ලබා දුන්නා මීස සභාව. ඔක්කොම නෙමෙයි. හැබැයි හුග දෙනෙ විශේෂයෙන් ම කාන්තා පක්ෂය හුඟක් නායකත් දුන්නා. මදනායකල, මුදලිගේලා, සිල්වා, ටොලම් වගේම අත්තිවාරම් කපන්න ජෙරි සුරවීරලා, පාලි අබේවික්‍රම, බ්‍රයන් මට හැමෝගෙම නම් මතක නැහැ. වගේ සැලකිය යුතු පිරිසක්, විශේෂයෙන්ම තරු කණ්ඩායම මේ වැඩේදි අපිත් එක්ක හිටිය.

**පැවිදි සොයුරියන්ගේ පැත්තෙන් මොන ව සහයෝගයක් ද ලැබුනේ. විශේෂයෙන්ම පොලි පෙරේරා මව්තුමිය එවකට ක්‍රිස්තුරාජ විදුහ විදුහල්පතිනිය. ඒ වගේම දොමිනිකානු නිකා ප්‍රාදේශාධිපතිනිය. එතුමිය මොන වගේ සහයෝගයක් ලබා දුන්නේ?**

සිස්ටර් පොලීන් විශාල සහයෝගයක් දුන්න දේවස්ථානය හදන්න. ආරම්භයේ ඉඳලා අවසානය දක්වාම කන්‍යා සොයුරියන් උපරිම සහයෝගයක් ලබා දුන්නා. විශේෂයෙන් ම අධ්‍යාත්මික අංශයෙන් ධර්මදාන සේවාවන්වලදී මට මතකයි හෝකන්දර, දික්හැතැක්ම වගේ දුෂ්කර ප්‍රදේශවල සේවාවන් සඳහා විශාල දායකත්වයක් සිස්ටර්ස්ල ලබා දුන්නා. ඩොමිනිකන් සිස්ටර්ස්ල නිකායක් වශයෙන් සෑහෙන සහයෝගයක් දුන්නා.

**දේවස්ථානයට මුල්ගල තැබුව දිනය ගැන ඔබවහන්සේට මතකයක් තියෙනවද? කව්ද ආවේ උත්සවයට?**

මම සාමාන්‍යයෙන් ඕනම වැඩක් පටන් ගන්නේ දේව මෑණියන් හා සම්බන්ධ දිනයක. එදා අපි මුල්ගල තිබ්බේ 1984 දෙසැම්බර් 8 හරි 9 වගේ තමයි මට මතක. ගරු රේමන්ඩ් පීරිස් පියතුමා (පසුව රදගුරු ධුරයට පත්වූ) තමයි ආවේ. ඒත් එක්කම ටොම් බ්ලොම් මහත්මා විශේෂයෙන්ම උදව් උනා. අත්තිවාරමට ඒ මහත්මා තමයි උදව් කළේ.

**කොතරම් කාලයක් ගත උනාද දේවස්ථානය ගොඩනගල අවසන් කරන්න?**

අවුරුද්දකුත් මාස නවයක් වගේ මට මතක විදිහට. අපි 1986 නොවැම්බර් මංගල්‍යයට තමයි දේවස්ථානය විවෘත කළේ. 1984 දෙසැම්බර් මුල්ගල් තිබ්බට අපි ඇත්ත වශයෙන් වැඩ පටන්ගත්තේ 1985 ජනවාරි පහුවෙලා.

**ඔබවහන්සේට මතකද දළ වශයෙන් කොච්චර විතර මුදලක් ඇස්තමේන්තු කරාද කියල දේවස්ථානය ගොඩනැගීමේ ව්‍යාපෘතියට. කොච්චර මුදලක් දළවශයෙන් ගියාද දේවස්ථානය ගොඩනගල අවසන් වෙනකොට?**

මට මෑතක් වෙනකල් නම් ඒ ගැන මතකයක් තිබුණ. ඇත්තටම දැන්නම් මට මතක නැහැ.

**මුදල් උපයන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන්න සිද්ධ උනාද ඔබවහන්සේලාට?**

අපි මිනිස්සුන්ගෙන් රුපියල් දාහ ගානේ එකතු කළා. සමහර අය වැඩිපුරත් දුන්නා. පළවෙනි ඉරිදා විශේෂ සම්මාදමක් තිබ්බ. ඊට පස්සේ මල්පැල හිටවල ඒවා විකුණන විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළා. ඒ වගේ ම ඒ දවස්වල හරි ජනප්‍රියයිනේ කොටු කාඩ් අන්න එහෙමත් කළා. පිටරට යුවලක් හිටිය එයාලත් යම් මුදල් ප්‍රමාණයක් දුන්නා.

**කව්ද මුදල් භාරව කටයුතු කළේ. ඔබවහන්සේද නැත්නම් වෙන කවුරුහරිද?**

මුදල් භාරව කටයුතු කළේ මම ම තමයි. මොකද මිනිස්සු මුදල් එහෙම නැත්නම් වෙනත් ආධාර ගෙනත් භාර දෙන්නේ මටනේ. ඉතිං මම තමයි ඒවාට අදාලව ගිණුම් තැබීම් සිදුකරේත්. මිනිස්සු කවදාවත් ප්‍රශ්න කරෙත් නැහැ මේ සල්ලි කොහොමද ලැබුනේ, කොහොමද වියදම් කළේ කියල. මිනිස්සු ලොකු සහයෝගයක් ලබා දුන්නා ඉක්මනින් ම මේ දෙව්මැදුර ගොඩනගා ගැනීමට.

**දෙව්මැදුර ගොඩනගල අවසන් උනාට පස්සේ ඔබවහන්සේට දැනුනද දෙවිඳුන්ට ප්‍රසන්න මන්දිරයක් ගොඩනැගුන කියලා. කොහොමද ඒ හැඟීම?**

ඔව් අනිවාර්යයෙන් ඒ සංතෝෂය තිබුණා. අහිංසක ආඩම්බරයක් දැනුනා. මට හිතුණා මේ දෙව් මන්දිරය ඇත්තටම දෙවියන්ට ප්‍රසන්න එකක් කියලා. මොකද ප්‍රශ්න, බාධක කොච්චර ආවත් මාස 18 ක් 19 ඇතුලත මෙහෙම විශාල දෙව්මැදුරක් අංග සම්පූර්ණව නිමකරා කියන එක ඇතුළෙම දේව අභිලාශය තියෙනවා කියලයි මට හිතුනේ.

**මේ දේව මන්දිරය ගොඩනගන අදහස ආපු මොහොතේ ඉඳන් ගොඩනගල අවසන් වෙන මොහොත දක්වා ගෙවුන කාලය අතර එක වරක් හරි ඊට වැඩි අවස්ථා ගණනකදි හරි ඔබවහන්සේට දෙවියන්වහන්සේ කථාකරාද? කොහොමද? මොකක්ද ලැබුණ පණිවිඩය?**

මෙහෙමයි. ශ්‍රද්ධවන්තයන්ට කථා කරා වගේ දෙවියන් වහන්සේ සෘජුවම කථා නොකළත් කාලයේ සලකුණු හා වෙනත් සිදුවීම් මගින් මම අත්දැක්කා ඒක දෙවියන් වහන්සේගේ මගපෙන්වීමක් කියල.

ඇත්තටම සොන්ඩර්ස් මහත්මයා ඇඳපු සැලසුමේ මම වෙනස්කරා සමහර දේවල්. උදාහරණයක් විදිහට දේවස්ථානයේ පිටත ඉස්තොප්පුවේ හරි මැදට තමයි කණුවක් දාලා තිබුණේ. පියතුමාව පේන්නෙත් නැහැ. මම කිව්වා පෙරහැරක් එනකොට, විවාහ මංගල යුවලක් එනකොට කෙලින්ම මැද තියෙන්නේ කණුව. ඒ නිසා මේ කණුව අයින් කරලා කණු දෙකක් දාමු කියලා. ඒක තමයි කණු දෙකක් උනේ. ඒත් එක්කම පඩිපෙළත් අඩි 4 යි තිබුණේ. මම කිව්වා ඒක මදි තව පළල් කරන්න ඕනේ කියලා. ඒකයි ඔය ප්‍රමාණෙට පළල් කළේ. ඒ වගේම

ශු. අල්තාරය තිබුණේ තව ඉස්සරහට. මම කිව්වා විශේෂ අවස්ථාවලදී පියතුමා මුණින් තලා වැටිලා යාච්ඤා කරනකොට එතන ඉඩ මදි වෙනව. ඒ නිසා පියතුමාට පිටිපස්සෙන් හිටගන්න ඉඩ තියල අපි අල්තාරය පස්සට ගන්න ඕනේ කියල. ඒකෙන් තමයි එතන අල්තාරය ඉස්සරහට ඔය වගේ ඉඩක් ආවේ. ඔය වගේ සුවිශේෂී වෙනස්කම් මම සැලසුමේ සිදුකරා. මම හිතන්නේ ඒවා සිදුවුනේ දේව මගපෙන්වීම යටතේ කියල.

**මම පෞද්ගලිකව විශ්වාස කරනවා පන්නිපිටිය ක්‍රිස්තුරාජ දේවස්ථානය තුළ දේව සංස්කරණය ක්‍රියාත්මක වෙනව කියල. මම මුලින් ඇහුව දේවස්ථානය හදන ව්‍යාපෘතියෙදි දේව සංරක්ෂණය ගැන. මම දැන් අහන්නේ ඒකට පරිබාහිරව ඔබවහන්සේ මේ ශුද්ධ භූමිය තුළ දේව සංරක්ෂණය අත්දැක්ක අවස්ථා තියෙනවද?**

මම පූජක ජීවිතය තුළ වැඩියෙන් ම දේව සංරක්ෂණය අත්දැක්කේ පන්නිපිටිය මීසම තුළ. මම ඇත්තටම පන්නිපිටියට ආවේ වෙන තැනකට යන්න ගිහිල්ල. පන්නිපිටිය ඒ දවස්වල ගත්තම පහසුකම් තියෙන මීසමක් නෙමෙයි. ඇත්තටම ඉස්සර කථාවක් තියෙනව සුවාමි කෙනෙක්ට යම් පාඩමක් උගන්වන්න දඬුවමක් හැටියට දාන තැනක් කියල පන්නිපිටිය. මාව එහෙම නෙමෙයි දැම්මේ. එතරම් දුෂ්කරයි පන්නිපිටිය. ඉතිං මම නුගේගොඩ ඉදල පන්නිපිටියට එනව කියන්නේ හැම අතින්ම පහසුකම් අඩුයි. හැබැයි ඒ හැම අභියෝගයකටම මුහුණ දෙන්න අපිට පුළුවන් වුණා.

ආවට පස්සේ මම ගොඩාක් දේවල් අත්දැක්කා. මගේ ජීවිතේ වරප්‍රසාද රාශියක් මට ලැබුනේ පන්නිපිටියෙන්. මම වැඩිහිටි නිවාසයක් පවත්වාගෙන යනවා. ඒ වැඩිහිටි නිවස ආරම්භ කරන්න හැකියාව ලැබුණේ පන්නිපිටියේ දි. හෝකන්දර ගෙවල් හදන්න ආපු මහත්මයෙක් තමයි ඒකට සහය දුන්නේ. ඇත්තටම මම වැඩිහිටි නිවසක් නෙමෙයි ළමා නිවාසයක් පටන්ගන්නයි හිතන් හිටියෙ. ඒත් මට හැකියාව ලැබුණා වැඩිහිටි නිවාසයක් ආරම්භ කරන්න. මම ඉතිං අර මහත්මයාට කිව්වා මගේ හිතේ තියෙන අදහස. ඔහු කිව්ව ඉඩමක් හොයන්න කියලා. එහෙම තමයි ඒ වැඩේ සිද්ධ උනේ. ඇත්ත වශයෙන් ම දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයක් තමයි අපේ බලාපොරොත්තු ඉටුකරගැනීමට මගපෙන්වීම. ඒ වගේ වරප්‍රසාද රාශියක් මම පන්නිපිටියෙන් අත්දැකල තියෙනවා.

ඒ වගේම පන්නිපිටියෙ ජනතාව හොඳයි. දැනුත් හොඳ ඇති මම හිතන්නේ. ඒ දවස්වල හරිම සරලයි. ඒ වගේම හොඳ එකමුතුකමක් තිබුණා. කේන්ද්‍රස්ථාන විදිහට එතන ශක්තිමත්ව තිබුණ. මිනිස්සු එකතුකරන තැනක් උනා.

**ඔබවහන්සේ දේවස්ථානය විවෘත කරල අවුරුදු 28 පස්සේ ගිය අවුරුද්දේ ආපහු ආවා පන්නිපි ක්‍රිස්තුරාජ දේවස්ථානයට. එදා දේවස්ථාන සංවර් කමිටුව, ගරු මීසම් සේවක පියවරුන් එ එකතුවෙලා දේවස්ථානය තුළ ක්‍රියාත්මක කරල ති සංවර්ධන ව්‍යාපෘති කීපයක් ඔබවහන්සේ විවෘත ක ඔබවහන්සේගෙ කාලයේ දේවස්ථානය හා දේවස්ථානය ගැන ඔබවහන්සේගේ අදහස මොකක්**

ඇත්තටම විශේෂ දියුණුවක් මම එදා දැ විශේෂයෙන් මම කියන්න ඕනේ ක්‍රිස්තුරජාණන් ප්‍රතිමාව මට ලොකු සතුටක් ගෙන දුන්නා. ඒ ප්‍ර මණ්ඩපය ඉතා දැකුම්කලුව නිර්මාණය කරල ති මම හිතන්නේ දේවස්ථානයේ ලොකු අවශ්‍යතාවය හරහා සම්පූර්ණ කරල තිබ්බ.

දේවස්ථානයට අලංකාරයක් එක්කරන වි සියල්ල ගොඩනැගී තිබුණා. ඒ ගැන අපේ ප්‍රශං හිමිවෙන්න ඕනේ. ඒත් එක්කම ආධ්‍යාත්මික වර්ධන තිබිය යුතුයි. මම හිතන්නේ ඒ ආධ්‍යාත්මික වර්ධන ප්‍රතිඵලයක් තමයි ඒ බාහිර සංවර්ධනය. ඒ ගැන ඇත්තටම සතුටු වෙනවා. මොකද මම විශ්වාස කර මිනිස්සුන්ගේ ඇතුලාන්ත ශ්‍රද්ධාවේ ශක්තිමත්කම තමයි දේවස්ථානය ගොඩනැගෙන්නේ. ඒක මිනි දකිනව.

ඒ වගේ පන්නිපිටිය දේවස්ථානයට ගියාම සතුටුයි. මොකද මිනිස්සු කැපවෙලා මේ දේවස්ථා ක්‍රම ක්‍රමයෙන් දියුණු කරන්න උත්සහ දරනව. ඒ මම අවංකවම සතුටුයි. මම කැමති මේ වැඩ කැපවෙලා වැඩකරන උදවියට ස්තූතිකර එයාලගේ කැපවීම, මහන්සිය පිළිබඳව.

**පන්නිපිටියෙ මීසම් සේවක පියතුමා විදහට ක කරනකොට පන්නිපිටිය දේවස්ථානයට අමතරව ත දේවස්ථාන කීපයක් ගොඩනගන්න මුලපුරන්න ඔ සිදුවුනා.**

දේවස්ථාන වශයෙන් අපි කිව්වොත් දේවස්ථාන කියන්නේ ගොඩනැගිල්ලක්නේ. ඒ අ ගත්තොත් දේවස්ථාන දෙකයි තිබ්බේ. මහරග පන්නිපිටියයි විතරයි. මහරගම තිබුණොත් කාමරයක්. මහරගම හැදුව ගරු ප්‍රැන්සිස් ප්‍රන පියතුමා.

රුක්මල්ගම අපි ඉඩමක් අරන් හැදුවා. ඒ වෙනකොට රුක්මල්ගම පවුල් 105 ක් හිටිය.

බොරලැස්ගමුවේ ඉඩමක් අරන් තිබුණා. ඒ වෙනකොටත්. අපි බොරලැස්ගමුවේ දේවස්ථානය හැදුවා.

ඊට පස්සේ අපි පටන් ගත්ත දික්හැතැක්ම. ඒ වෙනකොට ගෙවල්වල තමයි පූජාව තිබ්බේ. හැබැයි ඒ මිනිස්සු හරිම එකමුතුයි. ඊට පස්සේ අපි එතන ගෙයක් ගත්තා. එතන ශ්‍රමදාන කරනකොට හාමුදුරුවො කෙනෙක් ඇවිත් මට ගහන්න ගියා. මගෙන් ඇහුව උඹ සිංහලයෙක්ද කියල. දහම් පාසල් යවන්න ඕනේනම් සීසන් කාඩ් අරන් දීලා ළමයිව පන්නිපිටියට යවපං කිව්වා. ඔයවගේ ප්‍රශ්න තිබුණ. හැබැයි අපි ඒවට ශක්තිමත්ව මුහුණ දුන්නා. ඒ ගේ තිබුණ තැන තමයි දැන් ඔය දික්හැතැක්ම දේවස්ථානය ගොඩනගල තිබෙන්නේ.

හෝකන්දර පූජාව තිබ්බේ සමාජ ශාලාවේ. හෝකන්දර ඉඩම ගත්තේ, ගෙවල් හදල සල්ලි ටිකක් ඉතිරි වුණා මට මතක විදිහට රු. 175000/- ක් විතර. ගිවිසුමේ හැටියට ඉතිරි සල්ලි ජර්මනියට ආපසු යවන්න ඕනේ. හැබැයි අපේ ආණ්ඩුවෙන් කිව්ව එහෙම ලංකාවෙන් සල්ලි වෙන ආණ්ඩුවකට යවන්න බැහැ කියල. අපි ඇහුව මොකද කරන්නේ කියල. ජර්මනියෙන් කිව්ව එහෙනම් වෙන වැඩකට යොදවන්න කියල. එතන ඉඩම් කොටස් තුනක් තිබ්බ. ඒ කොටස් තුනම අපි ගත්ත. එහෙම අරගෙන එතන මොන්ටිසෝරි එකයි, වෛද්‍ය මධ්‍යස්ථානයයි, දේවස්ථානයයි හැදුව.

හෝමාගමත් මම එනකොට ආණ්ඩුවෙන් තහනම් කරල තිබුණ. අපි සැලසුම් අනුමත කරගෙන වහල මට්ටමට හදාගෙන එනකොට නැවත පෙත්සම් ගහල, විදුලි පණිවිඩයක් ලැබුණා වැඩ නවත්තන්න කියල. ඒත් අපි නැවැත්තුවේ නැහැ. පස්සේ පොලීසියෙන් ඇවිත් නැවැත්තුවා. අපි ඇත්තටම එතනදි ප්‍රමාද වුණා වැඩියි. අපි වෙන දේවල් බලන්නැතුව කණු ගහල වහල ගහල වැඩේ කරානම් අපිට ඒ ඉඩම නැතිවෙන්නේ නැහැ. යම් කිසි ප්‍රමාදයක් තිබුණා. මුදල් හිඟකමකුත් තිබුණා. සභාවෙන් ඔය ඉඩම වික්කා. පස්සේ කටුවාන කර්මාන්තපුරය ඇතුලෙන් වින්සන්ට් පෙරේරා මහත්මයා පර්චස් 40 ක් වෙන්කරා. ඊකත් දුරවැඩි වුණා. හෝමාගම දේවස්ථානය හදන්න ඔය විදිහට අපි අවස්ථා ගණනාවකදි උත්සහ කරත් ඒක සම්පූර්ණ කරගන්න බැරිවුණා.

මත්තේගොඩත් පූජාව තිබ්බේ ගෙවල්වල. මත්තේගොඩ ඒ වෙනකොට පවුල් 90 ක් විතර හිටිය. ඒ අතර ඒ පැත්තේ ඉඩමක් කොටස් කරල විකුණුවා. මගේ සහය මීසම් සේවක පියතුමා විදිහට හිටියෙ රොබින්සන් පියතුමා මට එතුමා ඇවිත් කිව්වා "ෆාදර් මෙහෙම ලැන්ඩ්සේල් එකක් යනවා අපිටනම් හොඳයි" කියල. අපි ගිහින් ඒ ඉඩම් වෙන්දේසියේ කළමණාකරු මුණගැහුණා. ඔහු කිව්වා "මේක මේ ඉඩමේ හොඳම කොටස. පියතුමන්ලට ඕනේනම් තියන්නම්. හැබැයි ඇඩ්වාන්ස් එකක් දෙන්න" කියල. අපි ගිහිල්ල අගරදගුරුතුමාට කිව්ව. එතුමා එච්චර කැමති වුණේ නැහැ. මම එතකොට හිටපු පදවි භාණ්ඩාගාරික ලෙස්ලි පියතුමාට කිව්ව සහයෝගයක් දෙන්න කියල. මම කිව්ව වගේම අගරදගුරුතුමා ගරු ලෙස්ලි පියතුමාගෙන් අහල තිබුණ. පස්සේ අගරදගුරුතුමා කැමති වුණා ඉඩම ගන්න. හැබැයි කිව්වා භාගයක් සභාවෙන් භාගයක් මිනිස්සුන්ගෙන් දාලා ඉඩම ගමු කියල. මුලින් ඔක්කොම සභාවෙන් දුන්න. එතන පර්චස් 75 ක් අපි වෙන්කරගත්ත. ඉඩම් කොටස් තුනක්. මම මත්තේගොඩ අත්තිවාරම් මට්ටමට ගොඩනැගුවා. ඒ වෙනකොට මගේ මාරුවීම් සිද්ධ වුණා. ඒ දේවස්ථානයෙ ආරම්භය ලබාගන්න මට පුළුවන් වුණා.

**අවසාන වශයෙන් පන්නිපිටියෙ දේව ජනතාවට ඔබවහන්සේ දෙන පණිවිඩය මොකක්ද?**

*මම කැමතියි පන්නිපිටියෙ දේව ජනතාවට කියන්න එදා මීට අවුරුදු 30කට විතර එහා තිබුණ එකමුතුකම දිගටම තියාගන්න ඕනේ කියල. මම කියන්නේ නැහැ, දැන් නැහැ කියල. හැබැයි ඒක තවත් ශක්තිමත් වෙන්න ඕනේ. මොකද ඒ කාලෙ බලනකොට පන්නිපිටිය බෞද්ධ පරිසරයක වුණත් මීසමක් විදිහට යම් දැක්මක් තිබුණා. පිළිගැනීමක් තිබුණ ප්‍රදේශයෙ. ඉතිං ඒ තත්ත්වය තියාගන්න ඕනේ දිගටම.*

*අනිත් එක මම හිතන්නේ අපි අධ්‍යාත්මික වශයෙන් වැඩිදියුණු වෙන්න ඕනේ. ඕනෑම මීසමක ඒක තමයි හරය. ශ්‍රද්ධාව වැඩිදියුණු කරගන්න ඕනේ. අපි දකිනව අද එදාට වඩා සෙනග ගොඩක් වැඩියෙන් ඉන්නව. ඉතිං මගේ පණිවිඩේ තමයි ඒ එකමුතුකම තුළින් ප්‍රදේශයේ පහන් ටැඹක් වෙන්න ඕනේ කියන එක.*

---

*සංවාද සටහන :*
**නීතිඥ ලසන්ත මනෝජ් නානායක්කාර**

# 1986 සිට 2013 දක්වා
# නව දෙව් මැදුරේ මීසම් සේවක පියවරුන්ගේ සේවාව

පන්නිපිටිය මීසමක් ලෙස ප්‍රකාශයට පත්වීමත් සමග මීසම් සේවක පියවරුන් ලෙස,

| | |
|---|---|
| **ගරු ඩබ්ලිව්. දොන් සිල්වෙස්ටර් පියතුමා** | **(1956 - 64)** |
| **ගරු බර්ට්‍රම් තිරිමාන්න පියතුමා** | **(1964 - 65)** |
| **ගරු ආතර් එදිරිවික්‍රම පියතුමා** | **(1965 - 70)** |
| **ගරු බොනිෆස් මෙන්ඩිස් පියතුමා** | **(1970 - 74)** |
| **ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා** | **(1974 - 82)** |
| **ගරු මාකස් ෆර්ඩිනැන්ඩස් පියතුමා** | **(1982 - 90)** |

ඓතිහාසික මෙහෙවරක් පන්නිපිටිය මීසමට සිදුකරන ලදී.

නව දෙව්මැදුරේ නිර්මාතෘවන ගරු මාකස් ෆර්ඩිනන්ඩ්ස් පියතුමාගේ අට වසරක සේවා කාලයෙන් පසු 1990 සිට 2013 තෙක් මීසම් සේවයට එක් වූ මීසම් සේවක පියවරුන්ගේ නාමාවලිය මෙසේ ය.

| | |
|---|---|
| **ගරු. ජේ. ඩී. ඇන්තනී පියතුමා** | **(1990 - 1991)** |
| **ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා** | **(1991 - 1992)** |
| **ගරු ක්‍රිස්ටෝපර් ජූලියස් පියතුමා** | **(1992 - 1996)** |
| **ගරු ජේ. මිකර් පියතුමා** | **(1996 - 1997)** |
| **ගරු සිසිල් කුමාර පියතුමා** | **(1997 - 1999)** |
| **ගරු වික්ටර් ජයමාන්න පියතුමා** | **(1999 - 2003)** |
| **ගරු ග්‍රෙගරි ප්‍රනාන්දු පියතුමා** | **(2003)** |
| **ගරු ඉග්නේෂස් වර්ණකුලසිංහම් පියතුමා** | **(2003 - 2005)** |
| **ගරු ලලිත් පෙරේරා පියතුමා** | **(2005 - 2010)** |
| **ගරු බ්ලේස් කුරේ පියතුමා** | **(2010 - 2013)** |
| **ගරු ටිරොන් පෙරේරා පියතුමා** | **(2013 සිට)** |

1990 සිට 1991 දක්වා වසරක කාලයක් මීසමේ සේවය කළ **ගරු ජේ. ඩී. ඇන්තනී පියතුමා** ගේ කාලයේ සිදු වූ ස්වර්ණමය අවස්ථාව වූයේ, පැරණි කුඩා දෙව්මැදුරේ 60වන සංවත්සර ජයන්තිය පැවැත්වීමයි. එය අර්ථාන්විතව පවත්වන්නට ගරු පියතුමාත් සහයක ගරු සුනිල් ද සිල්වා පියතුමාත් මීසම් ධර්ම සේවා සභාවත් පියවර ගත්හ. කාලයක් අම්පිටිය ජාතික දෙව්සත්හලේ අදියුරු ලෙස සේවය කළ ගරු ජේ. ඩී. ඇන්තනී පියතුමා අද කොළඹ අගරදගුරු පදවියේ දේව කැඳවීම් අධ්‍යක්ෂකතුමා ලෙස කටයුතු කරයි.

මෙරට කිතුණු සභාවේ කීර්තිමත් පියතුමකු වූ **ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා** මීසම් සේවක ලෙස දෙවැනි වතාවටත් පත්ව ආවේ 1991 දීය. පන්නිපිටි[ය] මීසම් ඉතිහාසයේ දෙවතාවක් මීසම් සේවක ලෙ[ස] පත්වීම ලද එකම පියතුමා එතුමා ය. අගරදගුරු ධර්මදූත අධ්‍යක්ෂකතුමන් ලෙස අමිල මෙහෙවරක් ඉ[ටු] කළ මෙතුමා දුප්පත් පවුල් වලට නිවාස ලබා දුන් මෙ[...] ව්‍යාපෘතියක නියමුවාද විය. 2003 දී මේ මහා පූජක පු[ත්] රුවන ස්වර්ගස්ථ විය.

සැබෑ පූජක පුත් රුවනක් ලෙස නමක් දි[...] **ගරු ක්‍රිස්ටෝපර් ජූලියස් පියතුමා** ගේ මීසම් සේ[වා] කාලය වසර හතරකි. ඒ 1992 සිට 1996 දක්වා [...] එතුමාගේ ජනහද බැඳි සේවාව මීසම් වාසීන්ට අමත[ක] නොවේ. දිව්‍ය පූජා මෙහෙයයන් අර්ථාන්විත කරන්න[ට] දහම් පාසල් සේවාව නංවන්නට, මංගල දිව්‍ය පූජාව[...] වලදී වන්දනාවට මුල් තැන දෙමින් පවත්වන්නට ස[...] තරුණ සේවාව ප්‍රාණවත් කරන්නට ජූලියස් පියතු[මා] හැම විට ම කටයුතු කළේ ගිහි නායකත්වයට, තරුණ[...] ජවයට මුල් තැන දෙමිනි. පන්නිපිටිය මීසම් සේවාවෙ[න්] පසු තම සේවාව තවත් මීසම් කීපයකට ලබා දුන් ගර[ු] පියතුමා අදත් අපට ධෛර්යයවත් සංකේතයක් වෙමින් දේව සේවාවේ නියැලී සිටියි.

වසරක කාලයක් එනම් 1996 - 1997 සමග[...] මීසම භාරව සිටි **ගරු ජේ. මිකර් පියතුමා** ග[...] මෙහෙවරත් අමතක කරන්නට බැරිය. එතෙර[...] මෙතෙරට පැමිණ සිය පූජක දිවිය අප රටට කැප ක[...] එතුමා සිංහල භාෂාව හොඳින් ඉගෙන, අකුරට ත[...] සේවාව ඉටු කළ පූජක පුත් රුවනකි. අර්ථාන්විතව දේ[ව] මෙහෙයන් පවත්වන්නට එතුමන් ගත් උත්සාහය අ[...] පසසන්නෙමු. ඉතා වටිනා සේවාවකින් පසු මික[ර්] පියතුමා ස්වර්ගස්ථ විය.

ගරු මිකර් පියතුමාගෙන් පසු 1997 - 199[9] දක්වා අප මීසම් සේවක පියතුමන් ලෙස පත් වූය[ේ] **ගරු දොන් සිසිල් කුමාර පියතුමා** ය. සංගීත විශාරදයක[ු] වන එතුමාගෙන් අපට ඉටු වූ සේවාවන් අතර මුල් තැනක් ගත්තේ දෙව්මැදුරේ ගායනා කණ්ඩායම[...] අර්ථාන්විතව සංවිධානය කිරීමයි. මීසමේ අනෙකු[ත්] දේවස්ථානවල සේවාවන් ප්‍රාණවත් කිරීමටත්, දහම් පාසැල් දරුවන්ගේ සේවාව නංවාලීමටත්, දේව මෙහෙයයන් බැතිබරව සංවිධානය කරන්නටත්, ගරු පියතුමා කටයුතු කළේ ය. අදටත් එතුමා මීසම් සේවාවේ නියැලෙන අප අගරදගුරු පදවියේ සේවාදායක[...] පියතුමෙකි.

**ගරු වික්ටර් ජයමාන්න පියතුමා** ගේ සේවා කාලයත් අප දෙව්මැදුරේ කටයුතු ඉහළ නැංවුණ යුගයකි. ඒ 1999 සිට 2003 දක්වා වසර හතරක කාලයක් තුල ය. 2003 චතාරික සමයේ දී එතුමාගේ මූලිකත්වයෙන් ගිහියන් කණ්ඩායමක් එක්ව සංවිධානය කල "ශ්‍රී කුරුසියේ ලකුනු පෙන්වීමේ" මහ සිකුරාදා දින මෙහෙය සුවිශේෂී අවස්ථාවකි. වෙනත් මීසමක ගිහියන් කණ්ඩායමක් ද සම්බන්ධ කර ගනිමින් මෙම අවස්ථාව අර්ථාන්විතව පැවැත්විණි. දෙව්මැදුරේ ගිහි නායකත්වය නැංවීමෙහිලාත්, දේව මෙහෙයයන්, දහම් පාසල් සේවාව, විවිධ සමිති සමාගම්, තරුණ කණ්ඩායම සංවිධානය කරන්නට, මෙහෙය වන්නට එතුමා ක්‍රියාකාරීව කටයුතු කළේ ය. වික්ටර් පියතුමා අද තේවත්ත ජාතික බැසිලිකා දෙව්මැදුරේ පාලකවරයා ලෙස සේවය කරයි.

වික්ටර් ජයමාන්න පියතුමාට පසුව අප මීසම් පාලක පියතුමන් ලෙස පැමිණි **ග්‍රෙගරි ප්‍රනාන්දු පියතුමා** ට අප මීසම තුල සිටීමට හැකි වූයේ මාස හයක් වැනි කෙටි කාලයක් පමණි. එම කාල පරිච්ඡේදය තුලදී එතුමා කල සියලුම කාර්යන් අපි මීසමක් ලෙස අගයකරමු.

කෙටි කාලයක් දෙව්මැදුර හා සම්බන්ධව පැවති අර්බුදකාරී තත්වයක් නිමවා නැවතත් ගිහියන් එකමුතුකොට ගෙන සේවාවන් ප්‍රාණවත් කිරීමට 2003න් පසු වසරක කාලයක් **ගරු ඉග්නේෂස් වර්ණකුලසිංහම් පියතුමා** ක්‍රියා කළ ආකාරය ඇගයිය යුතු ය. තම සේවා කාලය තුලදී එතුමා සියලුම දේව මෙහෙයන් ජනතාවට සමීප වන අයුරින් සංවිධානය කරන්නට විශේෂ වෙහෙසක් ගත්තේ ය. අදත් එතුමා තම සේවාව කැප වීමකින් යුතුව අප සභා මාතාවට ලබාදෙයි.

2005 සිට 2010 දක්වා **ගරු ලලිත් පෙරේරා පියතුමා** මීසම් සේවක පියතුමා ලෙස කටයුතු කලේ ය. ඉහළ සංවිධාන ශක්තියකින් ද, ගිහි නායකත්වයට මුල් තැන දෙමින් ද කටයුතු කිරීම ලලිත් පියතුමාගේ සේවා සමයේ දී කැපී පෙනුන ලක්ෂණවේ. දෙව්මැදුරට අයත් නුවාන කොට්ඨාශ ක්‍රමය ප්‍රතිසංවිධානය කරන්නටත්, මීසම් සභාවට නව ගිහි නායකයින් හඳුන්වා දෙන්නටත්, වාර්ෂික මංගල්‍යය ධර්ම විවේක අවස්ථාවක් ලෙස පවත්වන්නටත් පියතුමා ගත් පියවර අද මල් පල දරා තිබේ. දහම් පාසැල් සේවාව ප්‍රාණවත් කොට මීසමේ දහම් පාසැල් අතර වාර්ෂික ක්‍රීඩා උළෙලක් පැවැත්වීම ඇරැඹුනේ එතුමාගේ මගපෙන්වීම යටතේය. තරුණ කණ්ඩායමට, දහම් පාසලට, සමිති සමාගම්වලට හා මීසම් සභාවට නව ජවයක් දෙන්නට එතුමා විසින් ධර්ම විවේකයන් හා වැඩමුළුවාරයන් රැසක් සංවිධානය කරන ලදී. ගරු ලලිත් පියතුමා අද දළුගම මීසමේ සේවය කරයි.

**ගරු බ්ලේස් කුරේ පියතුමා** ගේ සේවා කාලය වන්නේ 2010 සිට 2013 දක්වා ය. දෙව්මැදුරේ දේව මෙහෙයන් දේව වචනයට උචිත පරිදි පවත්වන්නට එතුමා හැම විටම පියවර ගත්තේ ය. නව දෙව්මැදුරේ 25 වැනි සංවත්සරය නැතිනම් රජත ජයන්තිය අර්ථාන්විතව පවත්වනු ලැබුවේ එතුමාගේ මූලිකත්වයෙනි. අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මංගල මෙහෙය සඳහා පැමිණියහ. ගරු බ්ලේස් පියතුමා අද විදෙස් ධර්මදූත සේවාවේ යෙදී සිටියි.

2013 සිට **ගරු ටිරෝන් පෙරේරා පියතුමා** ගේ සේවා සමය යි. ගෙවී ගිය වසර තුන ඇතුලත එතුමාගේ සේවා කටයුතු ගැන සවිස්තරාත්මක ලිපි කීපයක් මෙහි වෙනම ම පළ කොට තිබේ.

---

**ක්‍රිස්ටෝපර් රණසිංහ**
ප්‍රවීන ආචාර්යය - මාධ්‍යවේදී සහ ලේඛක


හෝමාගම දිසාවේ
බාලදක්ෂ ව්‍යාපාරයට
කවදත් ලබැඳිව කටයුතු කරන
පන්නිපිටිය ක්‍රිස්තුරාජ දෙව්මැදුරේ
30වන වාර්ෂික මංගලෝත්සවයට
අපගේ උණුසුම් සුබපැතුම්...!



**දිසා කොමසාරිස් ඇතුළු**
**හෝමාගම දිසා බාලදක්ෂ සංගමය**

# අපේ දෙව්මැදුරටත්, මීසමටත් සේවය දුන් සහයක පියතුමන්ලා

මුල් යුගයේ පන්නිපිටිය මීසම් සේවක පියවරුන් තම සේවා කටයුතු මෙහෙය වූයේ, ගිහියන්ගේ සහය ලබා ගනිමිනි. ඔවුන්ට සහය වන්නට සහයක පියතුමන්ලා සිටියේ නැත.

පන්නිපිටිය මීසමට සහයක පියතුමකුගේ සම්ප්‍රාප්තිය සිදු වන්නේ, නව දෙව්මැදුරේ උදානයත් සමග ය. ඒ 1986 දී ගරු රොබින්සන් විජයසිංහ පියතුමාගේ පැමිණීමෙනි. මීසම් සේවක ගරු මාකස් ෆර්ඩිනන්ඩ්ස් පියතුමා, එදා අගරදගුරුව සිටි අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් වෙත කළ ඉල්ලීමට අනුව, එතුමන් විසින් නව පූජාත්වර කණ්ඩායමේ ගරු රොබින්සන් පියතුමාව පන්නිපිටියට එවන ලදී.

1986 - 88 වසර දෙකක් පුරාම රොබින්සන් පියතුමා සහයක පියතුමන් ලෙස තම කාර්යය ඉටුකලේ ය. නව දෙව්මැදුරේ අභිසෙස් උළෙල සංවිධානය කරන්නට එතුමා අප සමග උරෙන් උර ගැටී කටයුතු කළ ආකාරය අමතක නොවේ. විශේෂයෙන් මීසමේ තරුණ කණ්ඩායම් සවිබල ගැන්වීමටත් සෙසු මධ්‍යස්ථාන වල සේවා කටයුතු ප්‍රාණවත් කරන්නටත් එතුමා ඉහළ දායකත්වයක් ලබා දුන්නේ ය. රොබින්සන් පියතුමා අද ශුද්ධෝත්තම පියාණන්ගේ වතිකානු අපෝස්තලික සේවයට සම්බන්ධ වී සේවය කරයි.

අප මීසමට 'සහයක පියතුමා' ලෙස පැමිණි සියලූම පියතුමන්ලා හට සේවය කිරීමට හැකි වූයේ උපරිමය අවුරුදු දෙකකි. එලෙස වසර දෙකක් බැගින් සේවය කළ සහයක පියවරුන් වන්නේ,

| | |
|---|---|
| **ගරු රොබින්සන් විජේසිංහ පියතුමා** | **(1986 - 1988)** |
| **ගරු සුනිල් ද සිල්වා පියතුමා** | **(1990 - 1992)** |
| **ගරු රොෂාන් ප්‍රනාන්දු පියතුමා** | **(1992 - 1994)** |
| **ගරු කාල්ටන් සිල්වා පියතුමා** | **(1994 - 1996)** |
| **ගරු අර්නස්ට් ද මැල් පියතුමා** | **(1997 - 1999)** |
| **ගරු ක්ලෝඩ් නොනිස් පියතුමා** | **(1999 - 2001)** |
| **ගරු ප්‍රසාද් පෙරේරා පියතුමා** | **(2001 - 2003)** |
| **ගරු චමින්ද වනිගසේන පියතුමා** | **(2003 - 2005)** |
| **ගරු රසික ලෝරන්ස් පියතුමා** | **(2010 - 2012)** |
| **ගරු තුසිත සෝලංගආරච්චි පියතුමා** | **(2014 - 2016)** |

එමෙන්ම **ගරු සුදත් ගුණතිලක පියතුමා, ග**
**රන්ජන් සිල්වා පියතුමා, ගරු මේරියස් ක්‍රිෂාන්ත**
**පියතුමා, ගරු හිෂාන්ත පෙරේරා පියතුමා, ග**
**ලක්නාත් කුරේ පියතුමා, ගරු ගීතාල් ඇනස්ලි පියතු**
**ගරු ෂාමි දසනායක පියතුමා, ගරු සුරංග ෆොන්සේ**
**පියතුමා, ගරු රුවන්ත කුමාර පියතුමා, ගරු සුමි**
**රෝෂන් පියතුමා, ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමා** ය
සහය මීසම් සේවක පියවරුන්ගේ සේවය ද අප මීසම
ලැබීමට තරම් අප භාග්‍යවන්ත විය.

මෙතෙක් මීසමේ සේවය කළ සියලුම සහය
පියවරුන්ගේ සේවාව අප ඇගයීමට ලක් කරන්නෙ
මීසම් සේවක පියවරුන් සමග එක්ව ඔවුන් ක
මෙහෙවර අපේ වංශ කතාවේ ලියවී හමාරය. අ
පන්නිපිටිය දෙව්මැදුරේත්, සෙසු මධ්‍යස්ථානව
දෙව්මැදුරුවලත් දේව මෙහෙයයන් හා මංගල්‍යය
සංවිධානය කිරීමේ සියලු කටයුතු, දහම් පාසැල් ස
තරුණ කටයුතු සේවා, විවිධ සමිති සමාගම් වෙනුවෙ
සේවාව, ගිහි සම්බන්ධතා සේවාව ආදී කටයුතු රැස
හිටපු "පුංචි සුවාමිලා" විසින් ඉටු කරන ලදී.

අපේ හිටපු පුංචි සුවාමිලාගෙන් සමහ
දෙනෙක් අද මීසම් සේවක පියවරුන්ය. තව
කීපදෙනෙක් අධ්‍යාපන සේවයට සම්බන්
අදියුරුවරුන් ය. තවත් කීප දෙනෙක් අගරදගු
පදවියේ අපෝස්තලික සේවාවන් වල මූලිකයින්
වියත් දේශනා වාදීන් ය. අපේ ක්‍රිස්තුරජාණන්
දේවස්ථානය පාමුල සිට, ඉන් පිටවීගිය සියලු
පියතුමන්ලාට ස්වාමීන් වහන්සේගේ නොම
ආශිර්වාදය ලැබුන බව අපේ විශ්වාසයයි.

පන්නිපිටිය මීසම් ජනතාව ලෙස, අප මීසම
සේවය කල සියලූම මීසම් සේවක පියවරුන්ට
සහයක මීසම් සේවක පියවරුන්ටත් අ
ක්‍රිස්තුරජාණන්ගේ නොමද ආශිර්වාදය නිරතුරුව
ප්‍රාර්ථනා කරන්නෙමු.

---

**ක්‍රිස්ටෝපර් රණසිංහ**
ප්‍රවීන ආචාර්ය - මාධ්‍යවේදී සහ ලේඛක


ශුද්ධෝත්තම පියාණන්ගේ වතිකානු අපෝස්තලික තානාපති සේවයට සම්බන්ධ වී කටයුතු කරන අතිගරු රොබින්සන් විජේසිංහ හිමිපාණන් පන්නිපිටිය මිසමේ ක්‍රිස්තුරජාණන්ගේ නව දෙව්මැදුර ආසිරි ගන්වා විවෘත කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද සමරු කලාපයට එවකට සහය මිසම් සේවක පියතුමා ලෙස ලබාදුන් සුභාශිංසනය

# දෙව්මැදුරයි නව ජීවනයයි.

සියළු සැප සම්පත්, යස ඉසුරින් පිරුණු රාජකීය ජීවිතයේ රසයක වින්දනය ලබමින් සිටිනා මොහොතක, වඩා ගැඹුරු අවධානයක් යොමු නොවූ ජීවිතයේ සත්‍යතාව විඳින ගෞතම සිද්ධාර්ථ කුමරුන් හට එලෙස මුණ ගැසුනි. වයසින් දිරාපත්ව ගිය සිරුරකින් යුත් මහලු මිනිසකු (අනිච්ච), අසාධ්‍ය ලෙස රෝගාතුර වූ තැනැත්තෙකු (දුක්ඛ), භූමදානය සඳහා ගෙන යන මළ මිනියක් (දුක්ඛ) සහ ශාන්ත, නිසංසල මුහුණකින් ගමන් ගත් තාපසයෙකු එදා ගෞතම සිද්ධාර්ත කුමරුන්, ගෞතම බුදුරජාණන් වහන්ස ආලෝකය ලැබූ තිලෝගුරුන් බවට පත් කරනු ලැබීමට හේතු සාධක විය. ජීවිතයේ සියළු වේදනාකාරී මොහොතකම උදානයට 'තන්හාව' හේතුවන බව සොයාදුන් බුදුරජුන් ආර්යය අශ්ඨාංගික මාර්ගය මගින්, ජීවිත චක්‍රයෙන් (පටිච්ච සමුප්පාද) මිදුනු, කිසිදු ජීවිත තත්ත්වයකින් තොර නිර්වාන සම්පත අත්පත්කර-ගැනීමේ ධර්මතාවය මීට වසර දෙදහස් පන්සියයකට පමණ පෙර ලෝකයට පහදා දුන්සේක.

එම දෙසූ දහම්, ඇසූ සිංහල ජනයා, සිය සංස්කෘතික ජීවිතය හා ආශ්‍රිතව ගොඩ නැගූ බොදුනු දහම් දිවියේ පහස ලැබූහ. අප දෙස බසට එලෙස බොදුනු උරුව එක්කාසු විය. විදේශකයන්ගේ ආක්‍රමණ යුගයන් හිදී අප මව් දෙරණට වැඩම කළ කිතුණු දහම් රස අද ලබන්නා වූ අපි, එලෙස බොදුනු සහෝදර ජනතාවගේ ජීවිත සාරයෙන් පෝෂ්‍ය වූ පන්නිපිටිය නම් මෙම ග්‍රාමයේ ජීවත් වීමේ භාග්‍යය ලද්දෝ වෙමු.

මෙලොව සියළු සැප සම්පතක්ම තාවකාලික බව ද අනිසි ලෙස ලෞකික සැපසම්පත්වලට වහල්වීම සහ තන්හා උපද්දවාගැනීම තුලින් ජීවිතයේ විනාශයටත්, දුකටත් අප සැම වැටෙන බව ද පහදා දුන් අප ලොව්තුරා කිතු රජුන්, දෙව් පියාණන්ගේ කරුණාව ලැබ, ප්‍රේමයේ දහම් මග අනුසාරයෙන් ස්වර්ග සැපත අත්පත්කර ගත හැකිබව සිය ජීවිතයෙන් ලොවට ඉගැන්වූ සේක. එම නිමල කිතුදහමේ පහස ලබන ඔබ, බොදුනු සහෝදර ජනතාවගේ සහයෝගයෙන් අඩසියවස ජීවිත ගමනක යෙදී සිටියෝ ය. දෙව් පියාණන් වහන්සේගේ කරුණා බල මහිමයෙන් ද, ජේසු ක්‍රිස්තු සමිඳුන්ගේ දහම් මග අනුසාරයෙන් ද, ශුද්ධාත්මයාණන් වහන්සේගේ මගපෙන්වීමෙන් ද, එම ගමනෙහි යෙදුන ඔබ අද පන්නිපිටිය මිසම් ජීවිතයේ ඉමහත් ආනන්දජනක මොහොතක රස භුක්තිවිඳින්නෝ ය. දෙව් මැදුරක් නොමැතිවීම ගැන කෙනෙකු කන්කෙළිරි ගෑවා විය හැකි ය. දිව්‍ය පූජා මෙහෙයට සහභාගිවීමට නොහැකි වන්නේ සුදුසු දෙව් මැදුරක් නොමැති වීම නිසා යයි තවකෙනෙකු පැවසුවා විය හැකි ය. තව වදන්, ඔවදන්



අතිගරු රොබින්සන් විජේසිංහ හිමිපාණන් **1986** වසරේ

බොහෝමයක් අහස් කුසට එක්වුනා විය හැකිය. එය කෙලෙස සිදුවීදැයි නිර්ණය කිරීම ඔබ සැමට බාරයි.

ඔබ සැවොම එකමුතු වී සැදුවේ නව දෙව් විමනක් ය. එයයි ඔබ ලබා ඇති ජයග්‍රහණය. එයයි ඔබ මුවඟ රැඳි ඇති සිනහවේ සංකේතය. එලෙසම එකතු වී තැනුවේ දෙව් විමනක්, තනන්නටය පැසුණු මේරුණු, පරිණත කිතුණු පවුලක් ඔබ ග්‍රාමය තුල, බව අවබෝධ කරගත යුතුම ය. ඔබ හෙලූ ශ්‍රමයේ වටිනාකමක්, ඔබ දැරූ වියදමේ සාරයක් ඇත්තේ, නව දෙව් මැදුරේ අභිශේකයත් සමග ම ඔබ ජීවිත තුලින් කළ එළි දකින නවතාවය හෝ නව දැක්ම මත බව සිතේ තබාගන්න.

බොදුනු පරිසරයක ඉමහත් ආනන්දයෙන් සහ සාඩම්බරයෙන් ගොඩනැගුනේ ගලින් ගල දැවටුනු කිතුරජුන්ගේ මේ අර්ථවත් දේව ගෘහය යි. ගරු පියතුමන් හා එක්ව ඔබ සැම තැනූ ඒ දේව ගෘහයේ ලැගුම්ගන්නට අද දින කිතුතුමාණන් වැඩි සේක. එබැවින් එයින් ලබනා දහම් රස, දහම් සුව ඔබ දිවිලන ගමනට ගෙන යාමේ වැදගත් වූ කර්තව්‍ය භාර ගත යුත්තේ ද ඔබම ය. එනිසා, හඳුනා දෙන්නට කිතු තමන්ව අන් අයට, පළමුව ඔබ හඳුනා ගන්න එතුමාණන්ව. ගෙන යන්නට ප්‍රථම එතුමාණන්ව අන් අයට, ලබා ගන්න ප්‍රථමව ඔබ එතුමාණන්ව.

බුදු රජුන් බුදු දහම ලොවට දෙසුයේ ජීවිතාදර්ශයෙනි. කිතු රජුන් කිතු දහම ලොවට දෙසුයේ ද ජීවිත ආදර්ශයෙනි. එබැවින් ඉදිවුණ දෙව් මැදුර ඔබ වන්නට අමතක නොකරන්න.

*යදින්නට යාතිකා*
*ගයන්නට ගීතිකා*
*අසන්නට සුභ අස්න*
*ලබන්නට දෙව් පහස*
*මෙම දෙව් ගෘහයට ඔබ සැම රොක්වන්නා සේම,*
*ලබන්නා වූ දෙව් පහස*
*අසන්නා වූ සුභ වදන*
*බෙදා දෙන්නට නොලැබූ, නො ඇසූ අන් අය හට*
*අමතක නොකරන්න තැණුනු නව දෙව් විමන*
*ඔබ වන්න,*
*අමතක නොකරන්න දෙවිදු වසනා ඒ නිවස*
*ඔබ යන්න...*

නව දෙව් විමනේ දහම් සුවඳ ඔබ හා භුක් විඳීමේ භාග්‍ය ලද මම මේ අවස්ථාවේ දී ඔබ සැම ක්‍රිස්තු රජාණන්ගේ සුභ මංගලයයක් සහ එතුමාණන් සියළු ආසිරි ප්‍රාර්ථනා කරමි. නව දෙව් විමනේ සිහින සැබෑ කිරීමේ කර්තව්‍යය භාරගත් ගරු මීසම් සේව පියතුමන්ලාට ද එයට සහයෝගය දුන් ඔබ සිය දෙනාට ද මාගේ හෘදයාංගම සුභ පැතුම්...

ජේසු පිහිටයි.

**ගරු රොබින්සන් විජේසිංහ පියනම**
සහය මීසම් සේවක


පන්නිපිටිය

ක්‍රිස්තුරාජ් දෙව්මැදුරේ

30වන වාර්ෂික මංගලෝත්සවයට

මගෙන් උණුසුම් සුබපැතුම්...!



නීතිඥ නුවන් ජයවර්ධන

# දහම් දැනුමේ තෝතැන්න

ක්‍රි. ව. 1961 දී සියලුම ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීම නිසා කිතු දහමට සිදු වූ පසු බෑස්ම මඟහරවා ගැනීමට එවකට අප මීසම් සේවකව සිටි (අද අප අතරින් වියෝ වූ) ඩබ්ලිව්. දෝන් සිල්වෙස්ටර් රදගුරුතුමා දහම් පාසල් ක්‍රමය පන්නිපිටියේ ආරම්භ කරන ලදී. කුඩා බීජයක් ලෙස අරඹන ලද දහම් පාසල අද අතු පතර විහිදී ගිය මහා වෘක්ෂයක් බවට පත්වී ඇත. එදා සෑම ඉරිදාවක ම පන්නිපිටිය, මහරගම, හෝමාගම යන ස්ථානයන් හි ඉරු දින දිව්‍ය පූජාවට පසු දහම් පාසල පැවැත්වීමට කටයුතු සූදානම් විය.


ප්‍රථම දහම් පාසල් ත්‍යාග ප්‍රධානෝත්සවයේ දී.

පාසැල් රජයට පවරා ගැනීමෙන් පසු කිතුණු දෙමාපියන් තම දරුවන්ගේ ආගමික අධ්‍යාපනය ගැන දැඩි උනන්දුවක් දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස දීප ව්‍යාප්ත දහම් පාසල් ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා 'ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය' බිහිවිය. එහි පුරෝගාමී වූයේ ඩබ්ලිව්. දොන් සිල්වෙස්ටර් රදගුරුතුමාය. එතුමාගේ මඟපෙන්වීම යටතේ අප මීසමේ දහම් පාසල ක්‍රමවත්ව කරගෙන යාමට එවකට අප මීසමේ සිටි කතෝලික ගුරු මහත්ම මහත්මීන්ගේ හා මහරගම කාර්මේල් කන්‍යා සොහොයුරියන්ගේ සහය නොමදව ලැබිණි. ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වූ ඔවුන්ගේ සහය ඇතිව 1962 හා 1963 වර්ෂවල පැවැත්වූ ධර්මෝපදේශ කඳවුරු නිසා මීසම් වාසීන්ගේ එකමුතුකම වර්ධනය විය. එසේම දරුවන්ගේ අධ්‍යාත්මික වර්ධනයට එය බොහෝ උපකාරී විය. මෙම දහම් පාසල් කඳවුරු නිසා මීසමේ කිතුනුවන්ගේ එකමුතුකම සහෝදර දයාව වර්ධනය වීම හා එකිනෙකා ගැන අවබෝධයෙන් ක්‍රියා කිරීමට හැකියාව ලැබුණි.


ප්‍රථම දහම් පාසල් ත්‍යාග ප්‍රධානෝත්සවයේ දී.

අප මීසමට පත්ව ආ ගරු බර්ට්‍රම් තිරිමාන්න පියතුමා හා ගරු ආතර් එදිරිවික්‍රම පියතුමා, මීසමේ දහම් පාසල් ඉතිහාසයේ නොමැකෙන තරු විය. ගරු ආතර් එදිරිවික්‍රම පියතුමා වැඩිහිටි කිතුණු දෙමාපියන් තුළ දහම් දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ධර්මෝපදේශ පන්ති පැවැත්විය. 1967 දී එතුමාගේ මෙහෙයවීමෙන් පැවැති ධර්මෝපදේශ කඳවුර මීසමේ කිතුණු දරු දැරියන්ගේ හා කිතුණු දෙමාපියන්ගේ එකමුතුකම කදිමට පෙන්නු අවස්ථාවක් විය.


ප්‍රථම දහම් පාසල් ත්‍යාග ප්‍රධානෝත්සවයේ දී.

1970 අප මීසමට ආ ගරු බොනිපස් මෙන්ඩිස් පියතුමා මීසම පුරා දහම් පාසැල් පන්ති සංවිධානය කරමින් ක්‍රියා කිරීම නිසා

දහම් පාසලේ ප්‍රබෝධයක් ඇති විය. වැඩිහිටි හා තරුණ පිරිස්වල සහය ලබාගෙන 1972 හා 1973 වර්ෂවල පැවැත්වූ ධර්මෝපදේශ කඳවුරු නිසා මීසම් වාසීන්ගේ එකමුතුකම තවත් වර්ධනය විය. දෙමාපියන්, තරුණ තරුණියන්, ගුරුවර ගුරුවරියන් ආදී සැවොම උදෙසා මෙම කඳවුරුවලදී සාකච්ඡා වාරයන් පැවැත්වූ අතර, ඒවා ඔවුන්ගේ ජීවිත ගැටළු විසඳා ගැනීමට මහත් රුකුලක් වූවාට කිසිම සැකයක් නැත.

1974 දී අප මීසමට පත්ව ආ ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා අපට අමතක කළ නොහැක. හෝකන්දර, පනාගොඩ හමුදා කඳවුරේ හා අතුරුගිරියේ දහම් පාසැල් ආරම්භ කලේ මෙතුමාය. සංගීත විශාරද ගරු මර්සලීන් ජයකොඩි පියතුමා හා විශාරද නන්දා මාලනී මහත්මිය සම්බන්ධ කර ගනිමින් මීසමේ, කිතු දරු දැරියන්ට ගීයෙන්, විරිඳුවෙන් හා ඉඟි නලුවෙන් දහම් පණිවිඩය ජනතාව වෙත ගෙනයාමට "දූතික කිතුණු කලා පුබුදුව" ආරම්භ කලේ මෙතුමා ය. මෙතුමාගේ කාලයේ මීසම් සේවයට ඩොමිනිකානු ගරු සොහොයුරියන්ගේ පැමිණීම අප මීසමට උදා වූ විශාල භාග්‍යයක් විය. ක්‍රිස්තුරාජ විදුහල භාරගෙන කතෝලික විනය හා කිතුණු හැදියාව ඇති දරු පරපුරක් බිහි කිරීම සඳහා ඔවුන් ගන්නා නොමඳ උත්සාහය අප අගය කළ යුතුවේ. මෙම කන්‍යා සොහෝයුරියන්ගේ සහය හා මග පෙන්වීම ඇතිව පන්නිපිටිය, රුක්මල්ගම, මත්තේගොඩ, හෝකන්දර, හෝමාගම, දික්හැතැක්ම, දහම් පාසල් අද ක්‍රියාත්මක වේ. මෙම දහම් පාසල්වල අද ඉගෙනීම ලබන දරු දැරියන් ගණන 700ක් පමණ වන අතර, ගුරුවර ගුරුවරියන් 65ක් පමණ සේවයේ නිරත වේ. එසේම මෙම දහම් පාසල් ක්‍රමය පවත්වාගෙන යාම සඳහා අප මීසමට පත්ව ආ සෑම මීසම් භාර පියතුමෙක්ම හා සහාය පියතුමන්ලාගේ නොමඳ සහය ලැබුණි.

අවශ්‍ය පෙළ පොත් හා ගුරු අත් පොත් ලබා දෙමින් 'ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය' හා 'පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථානයේ' මග පෙන්වීම යටතේ අප දහම් පාසල අද ඉතාම ක්‍රමවත් ලෙස පවත්වාගෙන යාමට හැකියාව ලැබී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අප දහම් පාසල් දරුවන් බයිබල් දැනුම මිනුම තරග, බයිබල් කථික තරග, නාට්‍ය තරගවලට ඉදිරිපත්වී, දිසා මට්ටමින් ජයගෙන ජාතික මට්ටමට යාමට පවා අද හැකියාව ලැබී ඇත. ගරු කන්‍යා සොහොයුරියන් හා මීසමේ දහම් ගුරුවරුන්ගේ නොමඳ උත්සාහය කැපවීම ද එයට හේතු විය. අප දහම් ගුරු ගුරුවරියන් තම දහම් දැනුම වර්ධනය කර ගැනීම වඩා හොඳ සේවයක් ලබා දීමට උත්සාහ ගැනීම අගය කළ යුතු වේ. ධර්මාචාර්ය, විශේෂ, ගෞරව විභාග වලට පෙනී සිටිමින් ඔවුන් ගන්නා උත්සාහය කැපවීම අපට අමතක කළ නොහැක. එයට ග පියතුමන් දෙපලගේ නොමඳ සහය හා මඟ පෙන් ලැබීම අප ලද භාග්‍යයකි.

බොදුනු පරිසරයක් තුල මීසමේ දරුවන් දහම් දැණුම හා කිතුණු අධ්‍යාත්මය ගොඩ නැගීමට දෙමාපියන් උනන්දු වීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා දරුවන් දහම් පාසැලට යොමු කිරීම කිතු දෙමාපියන්ගේ පරම යුතුකම හා වගකීම වේ.

---

**රෝස් මුදලිගේ**


පන්නිපිටිය ක්‍රිස්තුරාජ දෙව්මැදුරේ
30වන වාර්ෂික මංගලෝත්සවයට
අපගේ උණුසුම් සුබපැතුම්...!

ප්‍රතිභා

**ප්‍රතිභා ජනතා පදනම**

**74/බී, මංගල මාවත,**
**හෝකන්දර දකුණ.**

# සමිඳුන් කෙත සරු වද්දන්නට කැප වූ අපේ පූජක පුතුන්

"දහසක් අතරින් මා තෝරා ගත්තා වූ සමිඳුනි ඔබහට නිරන්තරේ බැති ගී ගයන්නෙමි." මේ අපේ දේව මෙහෙයන්වල දී ගැයෙන හද බැඳ ගත්තා වූ ගීතිකාවකි. මේ අගනා ගීතිකාවෙන් කියවෙන්නේ විවිධාකාර වූ කර්තව්‍යයන් සඳහා දෙවියන් වහන්සේ අපව තෝරා ගන්නා බවයි. එය දහසක් අතරින් තෝරා ගත්තා වැනි ය.

ස්වාමින්වහන්සේගේ මිදි උයනේ සේවය සඳහා තෝරා ගන්නා කිතුනු පියතුමන්ලාටත් සෙසු පැවිදි සමූහයටත් මේ ගීතිකාව බොහෝ දුරට උචිත යැයි අපට සිතේ. අප මේ සටහන මෙවර තබන්නේ එලෙස තෝරා ගත්තා වූ පන්නිපිටිය මීසමෙන් බිහි වූ ගරු පියතුමන්ලා ගැන ය. මෙතෙක් ස්වාමින්වහන්සේගේ විශේෂ වරම් ලද හතර දෙනෙකු ගැන අපට කතා කළ හැකි ය.



ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමා

මහනුවර පේරාදෙණිය ගම් පියසේ උපත ලබා කොළඹට පැමිණි ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමා පන්නිපිටිය මීසමෙන් බිහි වූ පළමුවැනි පූජක පුත්‍රයා ය. 1985 දී පූජක වරම් ලැබූ එතුමා වසර 31ක කාලයක් සේවය සපුරා තිබෙන අතර ඉන් වැඩි ම කාලයක් ගත කොට ඇත්තේ කිතුණු විදුහල් අධ්‍යාපනය වෙනුවෙනි. කොළඹ සාන්ත ජෝශප් විදුහල සහ මොරටුව සාන්ත සෙබස්තියන් විදුහල් වල සේවය කළ එතුමා 2005 සිට 2013 දක්වා කොළඹ සාන්ත ජෝශප් විදුහලේ අදියුරු ධූරය ඉසිලීය. දේව ධර්මය, ගණිතය සහ පරිඝනක විද්‍යා උපාධි සම්පූර්ණ කොට තිබෙන ගරු පියතුමා දැනට ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නුවර දෙව්මැදුරක සේවය කරමින් ආචාර්ය උපාධිය සඳහා අධ්‍යාපන කටයුතුවල ද නිරත වෙමින් සිටියි.



ගරු ප්‍රියන්ත සිල්වා පියතුමා

කිතුණු කලා විශාරදයෙකු ලෙස අභිමානවත් නාමයක් හිමිකරගෙන සිටින ගරු ප්‍රියන්ත සිල්වා පියතුමා පූජක වරම් ලැබුවේ 1989 දී ය. දේව ධර්මය, ශාස්ත්‍රාචාර්ය සහ ජනසන්නිවේදනය පිළිබඳ උපාධි දිනා සිටින එතුමා, මීසම් සේවය, අධ්‍යාපනය, සන්නිවේදනය සහ කිතුණු දේශනා ආදී අංශවල සේවය ගැන පුළුල් අත්දැකීම් ලබා සිටියි. එතුමාගේ දෑතින් නිම වූ අගනා චිත්‍ර හා මූර්ති නිර්මාණයන් රැසකි. පන්නිපිටිය ක්‍රිස්තුරජාණන්ගේ දෙව්මැදුරට ඇතුලුවන දොරටුව අසල කුළුණු දෙකෙහි එතුමා අතින් නිර්මාණය වූ "මැව්ල්ලේ කතාව" ඇතුලත් චිත්‍ර හා මූර්ති රූප මාලාව විශිෂ්ඨ කලා නිර්මාණයකි. ගරු ප්‍රියන්ත

පියතුමා කොළඹ ඇක්වයිනාස් විශ්ව විද්‍යාලයේ උප අධ්‍යක්ෂක ධූරය හෙබවූ අතර දැනට ක්‍රිස්තියානි කළාව සහ වාස්තු විද්‍යාව පිළිබඳ අගරදගුරු පදවි කේන්ද්‍රයේ අධ්‍යක්ෂකවරයා ලෙස සේවය කරයි.



ගරු ජූඩ් ශ්‍යාමන් ප්‍රනාන්දු පියතුමා

සුප්‍රකට ඉඳිගොල්ල සාන්ත ජූඩ් මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ පාලකවරයා ලෙස දැනට සේවය කරන ගරු ජූඩ් ශ්‍යාමන් ප්‍රනාන්දු පියතුමා පූජාත්වරය ලැබුවේ 1990 දී ය. සෙසු පියවරුන් සේ බොරැල්ල සාන්ත ඇලෝසියස් දෙව්සත්හල සහ අම්පිටිය ජාතික දෙව්සත්හලින් පූජක පුහුණුව සම්පූර්ණ කොට අගරදගුරු පදවියේ මීසම් සේවයට එක් විය. නුගේගොඩ සහ දළුගම, පසුගිය සමයේ එතුමා මීසම් සේවක පදවිය හොබවමින් සේවාවන් රැසක් කළ මීසම් දෙකකි. මීසමේ දෙව්මැදුරු වල දේව මෙහෙයන් සහ සමිති සමාගම්වල සේවා ප්‍රවර්ධනය උදෙසා සාර්ථක සේවා මෙහෙවරක් ඉටු කිරීම අතින් පියතුමා ප්‍රසාදයක් උසුලයි. ඉඳිගොල්ල සාන්ත ජූඩ් මුනිඳුන්ගේ සිද්ධස්ථානය වැඩි දියුණු කිරීම සඳහා මේ දිනවල එතුමා කටයුතු කරමින් සිටියි.



ගරු ඩිලාන් ජැන්ස් පියතුමා

ගරු ඩිලාන් ජැන්ස් පියතුමා අප මීසමෙන් වූ හතරවැනි පූජක පුතුන් වේ. 2014 දී එතුමා පූ වරම් ලැබී ය. මීගමුව මහා වීදිය දෙව්මැදුරේ සහ පියතුමකු ලෙස එතුමා වසරක කාලයක් සේවය ක ය. 2015 දී කොළඹ සාන්ත ජෝශප් විද්‍යාලයේ ඇ මඩුල්ලට පත්වීමක් ලද අප පියතුමා එහි සේ කටයුතුවලට දායක වෙමින් සිටියි. පූජක දිවියේ ගමනක් යාමට අදිටන් කොට සිටින ඩිලාන් පියතුම නොමඳ දේවාසිරි පතමු.

මෙලෙස අප පූජක පුතුන් සිව්දෙනාට දේවා පතන්නේ සමිඳුන් කෙත අස්වද්දන්නට, නිහතම මෙහෙවරක් කරන්නට සහ අමිල සේවා සටහන තබන්නට ය. ඒ කැප වූ ගමන උදෙසා අප ක්‍රිස් රජාණන්ගේ ආශිර්වාදය ඔබට නිරතුරුව ලැබේවා! පතමු. අප සියලුම මීසම්වාසීන්ගේ ආශිර්වාදය ස යාච්ඤාව ද ඔබ සමග යි.


**ක්‍රිස්ටෝපර් රණසිංහ**
ප්‍රවීන ආචාර්ය - මාධ්‍යවේදී සහ ලේඛක



*ඔබ යා යුතු මග හිතා මතා සලසා ගන්න.*
*එවිට ඔබ කරන සියල්ල ස්ථිර වනු ඇත.*
*හරි මගින් දකුණට හෝ වමට හෝ නොහැරෙන්න.*
*ඔබේ දෙපා නපුරෙන් දුරු කරවන්න.*

හිතෝපදේශ - 4 : 26

# කිතුරද පුද බිමේ නව උදානය



වර්ෂ 1986 දී ආසිරි ගැන්වූ ක්‍රිස්තු රජාණන්ගේ නව දෙව්මැදුරේ නිර්මාතෘවරයා ගරු මාකස් ෆර්ඩිනැන්ඩ්ස් පියතුමාය. එවකට තිබූ නොයෙක් බාධකවලට මුහුණ දෙමින් එදා අපේ ක්‍රියාකාරීන් කණ්ඩායම සමග එක්ව කටයුතු කළ පියතුමාගේ අප්‍රතිහත ධෛර්යය නිසා පන්නිපිටියට නව දෙව්මැදුරක් ලැබිණ.

අද ක්‍රිස්තුරජාණන්ට කැප කළ දෙව්මැදුරත් ඊට අයත් භූමි භාගයත් නවතාවයක් ගෙන ඇති ආකාරය කාටත් දැකිය හැකිය. සිංහල භාෂාවේ කියමනකින් ප්‍රකාශ කළොත් "කලඑළි" වීමක් සිදුව තිබේ.

මෙහි ප්‍රමුඛයෝ මීසම් සේවක ගරු ටිරොන් පෙරේරා පියතුමාත්, සහයක ගරු තුසිත සෝලංගආරච්චි පියතුමාත්, දේවස්ථාන සංවර්ධන කමිටුවේ සභාපති නීතිඥ ලසන්ත මනෝජ් නානායක්කාර මහතා ප්‍රධාන දෙව්මැදුරේ නව සංවර්ධන කමිටුවත් ය. පන්නිපිටිය මීසමේ යටගියාවේ තතු හොඳින් දන්නා කෙනෙකු හැටියට මට කිව හැක්කේ මේ ප්‍රමුඛයින් කණ්ඩායම මීසම් ඉතිහාසයට ආලෝකමත් සටහනක් තබා ඇති බව ය. තවත් විදියට දෙවිඳුන්ට ප්‍රියමනාප වූ මෙහෙවරක් සම්පූර්ණ කොට ඇති බව ය.

මීසම් සේවක පියවරුන් දෙපලගේ මග පෙන්වීම හා ආශිර්වාදය මත නව සංවර්ධන කමිටුව මුලින් ම කළේ තම සිතැඟි සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා පුළුල් අරමුදලක් ගොඩ නැංවීම ය. ඒ වෙනුවෙන් ඉකුත් ඔක්තොම්බර් මාසයේ "කිතුරද ගී මියැසිය" නමින් සංගීත ප්‍රසංගයක් පවත්වන ලදී.

ප්‍රසංගය තුළින් ලද මුදල් සේම තවත් පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය ද සියල්ලට එක් විය. මෙහිලා මහරගම නගරාධිපතිනි කාන්ති කොඩිකාර මහත්මියගේ සම්බන්ධීකරණයෙන් බස්නාහිර පළාත් මහාමාර්ග ගරු අමාත්‍ය උපාලි කොඩිකාර මැතිතුමන් ලබාදුන් සුවිශේෂී දායකත්වයත්, බස්නාහිර පළාත් සභා මන්ත්‍රී රොඩ්නි ෆ්‍රේසර් මහතාගෙන් ලැබුණ සහයත් සිහිපත් කළ යුතු ය. ඉදිරි සංවර්ධන කටයුතු

සඳහා බස්නාහිර පළාත් මහ ඇමති ඉසුර දේවප්‍රිය මහතාගේ අවධානය ද මේ වන විට යොමු වී තිබීම ද සටහන් කළ යුතුව ඇත.

පියතුමන්ලා සහ සංවර්ධන කමිටු සාමාජික සාමාජිකාවන්ගේ කැපවීම සහ උනන්දුව මත පහත සඳහන් නවාංග දෙව්මැදුරටත් භූමියටත් එක්ව තිබේ. දෙව්මැදුරට පිවිසෙන ස්ථානයේ නව ගේට්ටුව, දෙව්මැදුර ඉදිරිපිට භූමිය ගල් අතුරා සකස් කිරීම, දෙව්මැදුරැ බිමේ ඉදිරිපිට ක්‍රිස්තුරාජණන්ගේ නව ප්‍රතිමාවක් ස්ථාපිත කිරීම, නව වේදිකාව, දෙව්මැදුරැ වහලේ වඩිම්බු සැකසීම, දෙව්මැදුර මුදුනත නව ප්‍රතිමාව, දෙව්මැදුරට පිවිසෙන පඩි පෙළ අසල සහ ඉදිරිපස ප්‍රතිමාව අසල ජල අලංකරණය, විදුලි බුබුලු සැකසීම ආදියයි. තවත් ඉදිරි කටයුතු කීපයක් සැලසුම් වෙමින් පවතී.

## පන්නිපිටිය ක්‍රිස්තුරාජ දේවස්ථාන සංවර්ධන කමිටුව - 2014 / 15


ගරු ටිරොන් පෙරේරා පියතුමා
ප්‍රධාන අනුශාසක


ගරු තුසිත සෝලංගආරච්චි පියතුමා
අනුශාසක


නීතිඥ ලසන්ත මනෝජ් නානායක්කාර
සභාපති


ප්‍රියන්තා අමරසේකර
ලේකම්


කොන්රඩ් ටිරෝන්
භාණ්ඩාගාරික


රෙක්ස් ආදිහෙට්ටි
සාමාජික


ශ්‍රීනාත් ජයසිංහ
සාමාජික


ෂුලානි චන්ද්‍රතිලක
සාමාජිකා


බර්නාඩ් සුසිල්
සාමාජික



# ප්‍රගමනයට සවිය මීසම් සංවර්ධන කමිටුව...



මීසම තුල ක්‍රියාත්මක බොහෝ කටයුතු සඳහා සක්‍රිය දායකත්වය ලබා දෙමින් ගරු පියවරුන්ගේ උපදෙස් හා අනුශාසකත්වය මත ක්‍රියාත්මක වන මීසම් සංවර්ධන කමිටුව සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි පමණක් සීමා නොවී ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ද විවිද ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ නිරතව සිටී. 2016 වසරේ පන්නිපිටිය ක්‍රිස්තුරාජ දේවස්ථානයේ 30වන වාර්ෂික මංගලෝත්සවය නිමිතිකොට ක්‍රියාත්මක වූ ආධ්‍යාත්මික සංවර්ධන වසර එයට කදිම උදාහරණයකි.

එමෙන්ම දෙව්මැදුර, ප්‍රජාවට හා ගමට සමීප කරනු වස් හෝමාගම දිසා බාලදක්ෂ සංගමය සමඟ ඒකාබද්ධව සංවිධානය කරන ලද සෞඛ්‍ය හා සමාජ සත්කාරක සේවා උපකාරක කඳවුර ද (2015 සහ 2016) මීසම් ඉතිහාසයේ නැවුම් ව්‍යාපෘතියකි.







## පන්නිපිටිය මීසම් සංවර්ධන කමිටුව



ගරු ටිරොන් පෙරේරා පියතුමා
ප්‍රධාන අනුශාසක



ගරු ක්‍රිෂාන් ජයශාන්ත පියතුමා
අනුශාසක



නීතිඥ ලසන්ත මනෝජ් නානායක්කාර
සභාපති



ප්‍රියන්තා අමරසේකර
ලේකම්



කොන්රඩ් ටිරෝන්
භාණ්ඩාගාරික



රෙක්ස් ආදිහෙට්ටි
සාමාජික



බර්නාඩ් සුසිල්
සාමාජික

# පන්සිපිරිය

# ක්‍රිස්තුරාජ දේවස්ථානය

# හා අනුබද්ධිත

# සමිති හා සංවිධාන

# ඔබවහන්සේ තෝරාගත් රාජ්‍ය ජනතාව අපි වෙමු.

ක්‍රිස්තු වර්ෂ 1673, දෙසැම්බර් මස 27 දින මාර්ගරීතා ඇල්කොක් තුමියට ක්‍රිස්තුස්වහන්සේ දර්ශනය වී මෙසේ වදාල සේක. 'සෑම මිනිස් හදකටම ඇතුලු වීම මාගේ ආශාවයි, මේ තුලින් නපුරාගේ බලවේගයන් අභිබවා යාමට අවශ්‍ය ශුද්ධවත් බවත් විමුක්තියත්, බලයත් ලබන්නට මාගේ දිව්‍ය හෘදයේ බැතිය ලෝ පතල කරන්න'යි ඔවුන් වහන්සේ ඇයට වදාළ සේක. මේ දිව්‍ය හෘද සමිතියේ මුල් ආරම්භය යි.

කොළඹ පදවිය කේන්ද්‍රස්ථානය වන අතර එය දිසා 14කින් සමන්විතය. කෝට්ටේ දිසාව මීසම් 7කින් සමන්විත වන අතර, පන්නිපිටිය මීසම අයත් වන්නේ කෝට්ටේ දිසාවට ය.

කොළඹ පදවි අධ්‍යක්ෂක ලෙස ගරු සුමිත් රෝෂන් පියතුමා පත්වී ඇත. කෝට්ටේ දිසා අධ්‍යක්ෂක ලෙස ගරු ඇන්සලම් ෆොන්සේකා පියතුමා කටයුතු මෙහෙයවන්නේ ය. කොළඹ පදවි නායක ලෙස සුනිල් විතාරණ මහතා ද, දිසා සභාපතිතුමිය ලෙස ආශා ඩයස් මහත්මිය ද, දිසා ලේකම් තුමිය ලෙස ගලැඩිස් ජයසිංහ මහත්මිය කැපවීමෙන් සේවය කරන්නේ ය.



ශ්‍රී හෘද සමිතිය පන්නිපිටිය ක්‍රිස්තුරාජ දෙව් මැදුරේ පිහිටුවන ලද්දේ වර්ෂ 1957 දී ය. එනම්, මීසම් පාලක තුමා ලෙස ගරු සිල්වෙස්ටර් පියතුමාගේ සේවා කාලයෙහි ය. එවකට සභාපතිතුමිය ලෙස ජොසෆින් මාර්ගරීතා පෙරේරා මහත්මිය සිය පවුලම ශ්‍රී හෘද සමිතියට එකතු කරගන්නට ක්‍රියා කළේ ය. පන්නිපිටිය ක්‍රිස්තුරාජ දෙව් මැදුරේ පිහිටුවා ඇති ශ්‍රී හෘද සමිතිය කෝට්ටේ දිසාවේ දෙවන පැරණිම සමිතියයි. මීට වසර ගණනාවකට ප්‍රථම, සමිතියේ සුබසිද්ධියට කැපවීමෙන් දූත මෙහෙවරේ යෙදුනු සියලු නිලධරයන් සහ සාමාජිකයින් (ජීවතුන් අතර නොමැති අය ද) හට අපගේ ගෞරවය හා ප්‍රණාමය පුද කරමු.

වර්ෂ 2015 මාර්තු මස 15 වන දින දිසාවේ අනුමැතිය ඇතිව දිසා නිලධරයන්ගේ සහභාගිත්වයෙන් සහ අප මීසම් පාලක ගරු ටිරෝන් පෙරේරා පියතුමන්ගේ සහයෝගයෙන් නව නිල මඩුල්ල තෝරා පත් විය. සභාපතිතුමිය ලෙස මාලින් රොසයිරෝ මහත්මිය ද, ලේකම් තුමිය ලෙස ඇන්ජලී රණසිංහ මහත්මිය ද, භාණ්ඩාගාරික ලෙස ක්ලිෆඩ් පැන්ස් මහතා ද තේරී පත් විය. වසර එකහමාරක් තුල වර්ධනය වූ අප සමිතියේ සාමාජිකයින් තිස් දෙනෙකුගෙන් බැඳී ඇත. විවිධ හේතූන් මත දුරස් වී සිටින සාමාජිකයින් සැමට ම ලිපියකින් ආරාධනා කොට කරුණු අවබෝධ කරන්නට ගරු පියතුමන් කටයුතු කළේ ය.

වසර 10 පසු කෝට්ටේ දිසා ශ්‍රී හෘද සත්ප්‍රසාද රැළිය වර්ෂ 2015 ඔක්තෝම්බර් මස 10 දින ඉතා උත්කර්ෂවත් ලෙස පවත්වන්නට හැකි විය. වර්ෂ 2016 ඔක්තෝම්බර් 22 දින කොළඹ පදවියෙන් පවත්වන ලද සත්ප්‍රසාද රැළිය තේවත්ත අප ස්වාමි දුවගේ දෙව් විමනේ අති ගරු මැල්කම් කාර්ඩිනල් හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පවත්වනු ලැබිනි. අප මීසමේ වසර 50ක සාමාජිකත්වය සපිරි රන් පදක්කම ලෝනා පෙරේරා මහත්මියට හිමි විය. එලෙසම වසර 25ක් පූර්ණ සාමාජිකයින් සත් දෙනෙකුට රිදී පදක්කම් හිමි විය. මෙවර කෝට්ටේ දිසා ශ්‍රී හෘද සත්ප්‍රසාද රැළිය සාන්ත තෙරේසා දෙව් මැදුරේ පවත්වනු ලැබීය. පදක්කම් ලාභීන් හට විශේෂ උපහාරයක් ද අප මීසමේ නවකයන් පස්දෙනෙකු පළමු පළඳනාව ලබා කැපවීම් අලුත් කළ හ.

එළඹෙන නත්තල් සමයේ අභ්‍යාස පොත් (පොත් ගැනීමට අපහසු ළමුන්ට) බෙදා දීම සඳහා ගරු පියතුමන්ලාට භාර දෙන්නට සියලු කටයුතු සූදානම් කරමින් සිටිමු.

**ශ්‍රී හෘදය සමිතිය**
පන්නිපිටිය මීසම

# මරිය හමුදාව



## නිරතුරු පිහිටාධාර දේව මාතාව

පන්නිපිටිය ක්‍රිස්තුරාජ දේවස්ථානයේ 2014. 09. 07 දින "නිරතුරු පිහිටාදාර දේව මාතාව" නමින් මරිය හමුදාව පිහිටවන ලදී.

පන්නිපිටිය මීසම් ඉතිහාසය තුල මරිය හමුදාව ඉතා ප්‍රබලව ප්‍රචලිතව තිබී ඇති අතර කාලයාගේ ඇවෑමෙන් එය අභාවයට යන ලදී.

ගරු ටිරෝන් පෙරේරා පියතුමාගේ පැමිණීමෙන් පසු, එතුමාගේ මැදිහත්වීම මත ලොරේන් ප්‍රනාන්දු මහත්මියගේ නායකත්වයෙන් මරිය හමුදාව නැවත පිහිටවන ලදී. ඉන් අනතුරුව ලක්ෂ්මී රොසයිරෝ මහත්මිය 2016 වර්ෂය දක්වා ඉතා ජීවලිතව ඉදිරියට ගෙනෙන ලදී.

2016. 06. 04 දින ගරු ටිරොන් පෙරේරා පියතුමා විසින් නව නිලධාරී මඩුල්ල ලෙස සභාපති ක්‍රිස්ටීන් පීටර්ස්, උප සභාපති ශ්‍රීමා පෙරේරා, ලේකම් මාලින් රොසයිරෝ, භාණ්ඩාගාරික පද්මිණි රණසිංහ යන මහත්මීන් පත්කරන ලදී. සාමාජිකාවන් සංඛ්‍යාව 16 දෙනෙකි.

මරිය හමුදාව යනු, කතෝලික සභාවේ ඉපැරණි ම නිල අවසරය හා වරප්‍රසාද ලත් සමිතියකි. අපගේ මෙහෙවර යාච්ඤා කිරීම පමණක් නොව, අපගේ ජීවිත ශුද්ධවත් කරගනිමින් අනෙකුත් ආත්මයන් සොයා යමින්, ශු. ජපමාලය, දේව මාතාව විශ්වයේ මෑණියන් ලෙස කතෝලික බැතිමතුන් අතර ප්‍රචලිත කිරීම වේ. අප ගැලවුම්කාර ජේසු සමිඳාණන්ට ලෝකය දිනා දීමේ නොවරදින මාර්ගය අප මීසම අතරට පමුණුවාලීම අපගේ ඉලක්කයයි.

## මරිය මව් තුමී අප හමුදාවේ රැජිණිය ඔබයි. වඳිමු බැතින් සුසුදු හදව

වර්ෂ 1889 ජුනි මස 7වන දින අයර්ලන්
ඩබ්ලින් නුවර උපත ලැබූ ප්‍රෑන්ක් ඩෆ් 18 වැනි වි
සිවිල් සේවාවට ඇතුලු වී දීප්තිමත් වෘත්තිකයෙක්
එතුමා වර්ෂ 1921 සැප්තැම්බර් 07 දින ඩබ්ලින්
මරියතුමියගේ ශාඛාව පළමු ප්‍රසීඩියම ආරම්භ ක
එම බීජය සරු ලෙස පල දැරීය. වික්‍රමාන්විත
ලොව පුරා පැතිර ගියේ ය. වසර 91ක් වන තුරු
වලඳා එතුමන් ස්වර්ගස්ථ වන තුරු මරිය හ
මෙහෙය විය. ගැලවීමේ සැලැස්ම
ශුද්ධාත්මයාණන්වහන්සේගේ සහ නිර්මල
තුමියගේ කාර්ය භාරය කර නිසි අයුරින් දූත සේ
ඔප නංවා ගිහි සැදැහැවතුන්ට තමන්ගේ දූත කා
පිළිබඳ මනා දැනුමක් ලබා දීමට එතුමන්
'ලෙජියෝ මරියේ' නමින් පොත සම්පාදනය කළේ

මරියතුමියගේ හමුදාවට පළමු
සාමාජිකයින් ඇතුලත් කර ගනු ලැබුවේ
සැප්තැම්බර් 07 වන දින ය. මෙම සංවිධානය ද
අප ස්වාමිදුවගේ හමුදාව නමින් හඳුන්වන ලදී.
මාතාවන්ගේ මැදිහත්කමින් මෙහෙයවනු ලබන
හමුදාව මරිය තුමියගේ බලවන්ත හමුදාවයි.

පන්නිපිටිය ක්‍රිස්තුරාජ දෙව් මැදුරේ
හමුදා සේනාංකය මීට වසර ගණනාවකට
පිහිටුවන ලදී. ඔවුන්ගෙන් සිදුවූ කාර්ය සහ මෙහෙ
අප ස්තූතිවන්ත වන්නෙමු. කාලයාගේ ඇවෑමෙන්
2014 ගරු ටිරොන් පෙරේරා පියතුමාගේ අනුදැනුම
ලොරේන් ප්‍රනාන්දු මහත්මිය මරිය හමුදාවට නව ප
දීමට කැප වූවා ය. ඇයගේ රෝගී තත්ත්වය
ලක්ෂ්මී රොසයිරෝ මහත්මිය එම ගමන යන්නට
දුන්නා ය. සාමාජිකයින් 16 දෙනෙක්ගෙන් සමන්විත
හමුදාව නිරතුරු පිහිටාධාර දේවමාතාවන්ගේ
ප්‍රසීඩියම නමින් හඳුන්වනු ලැබේ. සතිපතා
සෙනෙසුරාදා දිනකම උදෑසන දිව්‍ය පූජාවෙන්
සමිතිය රැස්වනු ලැබේ. දෙවර්ෂ පූර්ණ අප සමිති
නිහඬව සැදැහැවතුන්ගේ ඉල්ලීම් මත යාච්ඤා
හා කොට්ටේ කියුරියාවේ අදාල කටයුතු හා සේ
කිරීමට අප සහෝදරියන් කටයුතු කිරීම සත
කරුණකි.

ආදර දේව අම්මේ ඔබතුමියගේ තෝරා
දරු කැල ඔබතුමියගේ ගුණාංග වලින් පිරෙන්
සැළසුව මැනව. ඔබතුමියට මංගල වේවා!

අපගේ ඉදිරි වැඩ කටයුතු නම්, රෝ
බැහැදැකීම, පවුල් තුල ජපමාලය උච්චාරනය කර
මරිය බැතිය මීසම තුල වර්ධනය කිරීමයි.

# දේවස්ථානයේ ජීවනාලිය තරුණ සංවිධානයයි...



පන්නිපිටිය මීසමේ තරුණ සමිතියේ ප්‍රතිසංවිධානය ගරු රුවන්ත පියතුමා ප්‍රමුඛත්වයෙන් 2012 වසරේ සිදුකෙරුණු අතර, එකල තරුණ සමිතියේ සභාපති වශයෙන් රොමේෂ් පෙරේරා සොහොයුරා ද, උපදේශක වශයෙන් අරුණ සොහොයුරා ද කටයුතු කරන ලදී. තරුණ සමිතිය දේවස්ථානයේ වැඩකටයුතු සඳහා විශාල කාර්යයන් රැසක් සිදු කළහ. එනම්, දේවස්ථානයේ වහලය සෑදීම, තරුණයන් සඳහා වැඩමුළු පැවැත්වීම, සුහද ක්‍රිකට් තරගාවලි පැවැත්වීම වැනි දෑ පෙන්වා දිය හැක.

ඉන්පසු 2013 වසරේ ගරු ටිරෝන් පියතුමා සහ මීසම් සේවක ගරු දිනේෂ් පියතුමා සමග අත්වැල් බැදගත් තරුණ සමිතිය, දේවස්ථානයේ තරුණයන්ට විවිධ වැඩමුළු පවත්වමින්, ක්‍රීඩා තරග සහ සුහද හමු පවත්වමින්, තරුණ සමිතියේ එකමුතුකම වර්ධනය කර ගැනීමට මනා ලෙස ක්‍රියා කලහ. එම සමයේ සිට තරුණ සමිතියේ සභාපති වශයෙන් විශාන් දිලුම්ක සොහොයුරා ද උප සභාපති වශයෙන් නිල්මන්ත ආදිහෙට්ටි සොහොයුරා ද සමග සිටි තරුණ සමිතිය විශාල වශයෙන් දේවස්ථානය සඳහා සහයෝගය ලබා දුනි.

එසේ ම 2016 වසර තරුණ සමිතියට විශේෂ වසරක් විය. එවකට සහායක පියතුමාව සිටි ගරු තුසිත සෝලංගආරච්චි පියතුමාගේ අධීක්ෂණය යටතේ තරුණ සමිතිය තව තවත් ඉදිරියටම ගමන් කළේ ය. එසේම දේවස්ථානයේ සත්ප්‍රසාද මණ්ඩපය අසල පිහිටි කලාකාමී සිතුවම ද එම පියතුමාගේ අධීක්ෂණය හා මූලිත්වය යටතේ සිදු කරන ලද අවස්ථාවේ දී තරුණ සමිතිය විශේෂ දායකත්වයක් ලබා දෙන ලදී. වර්තමානයේ තරුණ සමිතිය භාරව කටයුතු කරන සහයක පියතුමා වන ගරු ක්‍රිශාන් පියතුමා සහ ගරු ටිරොන් පියතුමාගේ මග පෙන්වීම යටතෙක් ඉදිරියටත් අප දේවස්ථානයේ වැඩකටයුතු සඳහා සේවය කිරීමට බලාපොරොත්තු වෙමු.

ආධ්‍යාත්මික හා භෞතිකව ජීවිත සවිමත් කරන
## ශාන්ත වින්සෙන්ති පාවුලා සමිතිය



ආධ්‍යාත්මිකත්වයේ මංපෙත් විවර කරන
## පුබුදුව




## වත්පිළිවෙතට නිබඳ අතහිත
## පූජා උදව් සමිතිය



වරක් ගැයීම දෙවරක් යැදීමකි...

## ගායනා කණ්ඩායම



## -සටහන-

* මෙම බොහෝ සමිතිවල ඡායාරූපයේ පෙනී සිටි
සාමාජිකයන්ට වඩා වැඩි සාමාජිකයන් ප්‍රමාණය
සිටින නමුත් ඡායාරූපය ගන්නා දිනයේ පැමි
අය පමණක් ඡායාරූපයේ පෙනී සිටින අත
සහභාගී වීමට නොහැකි වූ සාමාජිකයන්ට අප
කණගාටුව ප්‍රකාශ කර සිටිමු.

* ඡායාරූපය ගැනීම සහ අදාල සමිති සහ සංවිධා
පිළිබඳව සංක්ෂිප්ත සටහනක් ලබා දෙන ලෙ
අදාල සමිතියේ වගකිය යුතු නිළධාරීන් දැනුව
කරන ලද අතර එසේ ලබා දුන් ලිපි පළකිරීම
කටයුතු කර ඇත.

**සංස්කාර**



සමිඳාණන් නුරුස්සන කරුණු සයකි. එතුමන්ට පිළිකුල් කරුණු සතකි.
අහංකාර ඇස් ද, බොරු කාර දිව ද, නිදොස් ලේ වගුරවන අත් ද, දුෂ්ඨ උපා යොදන සිත ද, නපුරට වහා දුව යන පා ද,
මුසා බස් තෙපලන බොරු සාක්ෂිකරු ද, මිතුරන් අතර වාදභේද අවුස්සන අය ද වෙත්.